## 2022/12/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/12.13 දින පෙ.ව. 09.30 ට  නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ආ්.ඒ.ඩබ් අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 26. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2022.12.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. මේ වර්ෂයේ අවසාන සභාවාරය ඒ වගේම අද විශේෂයි. මොකද 2023 වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කරනු ලබනවා. අපේ ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා අද දින සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා දුරකථනයෙන් මාව දැනුවත් කළා. ඒ අනුව අද දින මහා සභා රැස්වීමට සපැමිණී ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2022.11.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

2022.11.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන ආයතනවල මාසික මහා සභා රැස්වීම්වලදී ජ්‍යෙෂ්ඨත්වය අනුව සභිකවරුන් අසුන් ගැනීම සම්බන්ධව 2022.11.23 දිනැතිව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් 2022.12.08 දිනැතිව යොමු කරන ලද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රුස්වීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

03. ආදි ශිෂ්‍ය සංගමය, ගා/නාගොඩ රාජකීය ජාතික පාසල විසින් 2022.12.12 දිනැතිව යොමු කරන ලද විනෝද බද්දෙන් නිදහස් කර ගැනීම සම්බන්ධවයි.

04.යූ.ජී. විජිත, ජයන්ති බේකරිය,උඩුගම දකුණ, ගා/උඩුගම විසින් 2022.12.11 දිනැතිව යොමු කරන ලද භාවිතාකරන මාර්ගය "ජය මාවත" නමින් නම් කරන ලෙස කරනු ලබන ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**අයවැය ඉදිරිපත් කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගරු උප සභාපති තුමා ඇතුළු මන්ත්‍රීවරුනි, අද අප සභාවට විශේෂ දිනයක්. ඒ මන්ද, වර්තමාන අප සභාව 2018 මාර්තු සිට මාගේ සභාපතිත්වයෙන් 2022 වර්ෂය දක්වා අයවැය හතරක් පවත්වා ගෙන ඒමත්, අද දින අපගේ 05 වෙනි අයවැය ඉදිරිපත් කිරීමත් හේතුකොටගෙන, ඔබ අපි කවුරුත් දන්නා කරුණක් තමයි,

අපගේ මේ වසර පහ තුළ වෙනත් කිසිම සභාපතිවරයෙකුට මුහුණ දීමට සිදු නොවුන, බරපතළ අභියෝග වලට මා ලක්වීම පිළිබඳව (සහරාන් බෝම්බ සිද්ධිය, කොවිඩ් වසංගතය, අරගල) ඒ කිසිවකින් නොසැලී අප සභාව විසින් කළ හැකි දේ කරමින්, මධ්‍යම රජයේ ප්‍රතිපාදන සහ පළාත් ප්‍රතිපාදනවලින් ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති, කාපට් මාර්ග, කොන්ක්‍රීට් මාර්ග, ක්‍රීඩාපිටි සංවර්ධන, කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති ආදිය ක්‍රියාත්මක කළ බව, තව ද අප විසින් ඉදිරිපත් කරන මේ අයවැය වාර්තාවලින් සමහර යෝජනා මධ්‍ය රජයේ මුදල් ප්‍රතිපාදන හරහා ක්‍රියාත්මක වීමත්, සමහර යෝජනා පළාත් සභා පතිපාදන වලින් ක්‍රියාත්මක වීමත් තුළ, අප සභාවට එය ලොකු පිටුවහලක් වන බවත් සඳහන් කරන්න ඕන. තවද වර්තමාන ගරු ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේ මැතිතුමා සභාවට අයවිය යුතු දඩ, මුද්දර ගාස්තු ආදිය කලට වේලාවට ලබා දෙමින් ඉටුකරන සේවාව, ඉතා අගය කොට සලකන්න ඕන. කොහොම නමුත් වෙනත් සභාවන් හා සසඳන විට, අප සභා ආදායම් තත්ත්වය අහසයි පොළවයි වගේ. ආදායම් තත්වය බොහොම පහල තත්වයේ තියෙන්නේ. ආදායම් උත්පාදනය කිරීමට අවශ්‍ය යෝජනා අපි ඉදිරිපත් කළත්, ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකසා ගැනීමට තවමත් නොහැකි වී ඇත්තේ, ඒ සඳහා අවශ්‍ය සම්පත් නොමැති වීම නිසා බව සඳහන් කිරීමට කැමතියි. මේ සියලු කාරණා සිහිපත් කරමින්, 2023 අයවැය වාර්තාව ඔබතුමන්ලාට ඉදිරිපත් කරමි. එහි මාගේ පණිවිඩය පමණක් සභාවට වාචිකව ප්‍රකාශ කරන්නම්.

**ගරු සභාපතිතුමාගේ අයවැය පණිවිඩය.**

නාගොඩ ප්‍රාදේශීය සභාව

**<u>සභාපතිතුමාගේ අයවැය පණිවුඩය</u>**



නූතන දේශපාලන ඉතිහාසයේ අඳුරුම වකවානුව මේ යැයි සටහන් කිරීම වරදක් නැත. ඒ සඳහා බලපෑ සාධක රැසක් පවතී. රටේ පවත්නා දේශපාලන අස්ථාවරබව මෙන්ම ගෝලීය වසංගත තත්ත්වය මෙයට විශාල වශයෙන්ම බලපාන ලද බව අමුතුවෙන් කිවයුතු නොවේ. මෙමඟින් ජාතික ආර්ථිකය විෂයෙහි එල්ල වූ බලපෑම ද සුළුපටු නොවේ. ඒ හේතුවෙන් රටේ බොහෝ ආයතන මෙන්ම භාණ්ඩ හා සේවා තත්වයන්ද විශාල වෙනසකට බඳුන් විය. දේශීය වෙළඳපොළ හා ආර්ථිකය තුළ ඇතිවූ හිඟකම නිසාවෙන් ආර්ථික උද්ධමනය ද ඉහළ යන්නට විය. එමඟින් ජන ජීවිතයේ හා ජනතා සිතුම් පැතුම් විශාල කඩා වැටීමකට පත්විය. සමස්තයක් වශයෙන් ගත් කල රටේ ඉහළ ආයතනයේ සිට පහළම ආයතනය දක්වාම හුදෙකලා වීම හා සේවා නතර වීම පුදුමයට කරුණක් නොවේ.

අප ප්‍රාදේශීය සභාව ද එකී ග්‍රහණයට නතුවීම හේතුවෙන් පසුගිය වර්ෂයේ ක්‍රියාත්මක කරවීමට තිබූ බොහෝ වැඩ කොටස් අතපසු වීමත්, ජනතා අපේක්ෂා ඉටුකිරීමට නොහැකි වීමත් යන කාරණා මත අපටද කළ හැකි කිසිවක් නොවීය. මෙම ප්‍රකාශය නිකුත් කරන මෙම කාලවකවානුව තුළ ද තත්වය පෙර පරිදිමය. ඉදිරියේදීද තවත් යම් කාලයක් මෙලෙසට ගෙවන්නට සිදුනොවෙනවායි කියා කීමට නොහැකි තත්වයක පවතී.

මෙලෙස බොහෝ දුෂ්කරතා පවතින නමුත් ඉදිරි වර්ෂය සඳහා ප්‍රදේශයේ හඳුනාගත් සංවර්ධන කටයුතු හා සේවා වෙනුවෙන් සැලසුම් කරමින් සිටින අවස්ථාවක 2023 වර්ෂයේ අයවැය වෙනුවෙන් ප්‍රකාශයක් නිකුත් කිරීමට ලැබීම

යම් ආකාරයක සතුටට කාරණයකි. පසුගිය වර්ෂයේ අයවැය පණිවුඩය හරහා මවිසින් ක්‍රියාවට නැංවීමට යෝජිත වැඩ කොටස් අතරින් යම් ප්‍රමාණයක් ඉටු කිරීමට හැකි වුවද ජනතා අපේක්ෂා හා සිතැඟි පරිදි මහා පරිමාණයෙන් යථාර්ථයක් කරන්නට නොහැකි වූ බව මා මෙන්ම ඔබ ද පිලිගත යුතු කාරණයකි.

ප්‍රාදේශීය සභාව මඟින් ඉටුකළ යුතු අත්‍යවශ්‍ය මානුෂීය සේවාවන් වන ප්‍රාදේශීය මාර්ග නඩත්තු කිරීම්, මාර්ගස්ථ විදුලි ලාම්පු නඩත්තුව හා අළුත්වැඩියාව, පෙර පාසල් පවත්වා ගෙන යාම, සිය සේවක පඩිනඩි කලට වේලාවට ලබාදීම ප්‍රදේශීය සභාවට ආදායම් ලැබෙන ආයතන විධිමත් ආකාරයකින් පවත්වා ගෙන යාම, ප්‍රදේශයේ දිළිඳු පුද්ගලයින්ගේ ආර්ථිකය

නංවාලීමට අවශ්‍ය කටයුතු කිරීම ආදි කටයුතු රැසක් වෙනුවෙන් ක්‍රියාත්මක වීමට මා හට මෙන්ම සභාවට හැකියාවක් ලැබුණු බව කිව යුතුව තිබේ. මීට වසර දෙකකට පෙර ආරම්භ කළ වළකුඹුර ආදාහනාගාරයේ වැඩ පසුගිය වර්ෂය තුල අවසන් කිරිමට සැලසුම් කළද පැවති අයහපත් වාතාවරණය මත එය දිනෙන් දිනම කල්ගත විණි. ඒ සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන නොලැබීම ප්‍රධානම ගැටළුව බවට පත්විය. නමුත් මේවන විට එහි සුළු වැඩ කොටස් ආරම්භ කර ඇති අතර ඉදිරි අයවැයෙන් ඒ සඳහා මුදල් ලද වහාම වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරමි. පසුගිය අයවැය පණිවුඩයෙන් ඉදිරිපත් කළ ආකාරයට උඩුගම ඇප්‍රොප්වත්තේ ආර්ථික භෝග හා ළතුරු වගා කිරීමට මේ වන විට ආරම්භ කර ක්‍රියාත්මක තත්වයේ පවතී. විශේෂයෙන් මාපලගම ළමා විනෝද උද්‍යානය හා මහජන ක්‍රීඩාංගනය මේවන විට සකස් කර ඇති පඅතර එය ඉදිරියේදී තවදුරටත් දියුණු කිරීමට අපේක්ෂා කරමි.

කෙසේ වෙතත් ඉදිරියේදී උද්ගතවන තත්ත්වය හමුවේ වැඩ කළ හැකි වටපිටාවක් ඇති වුවහොත් සියළු යෝජනා හා වැඩ කොටස් නිමා කිරීම අපේක්ෂා කරන අතර මාගේ පස් වසරක සේවා කාලය තුල විශාල වැඩ කොටසක් කිරීමට හැකියාවක් ලැබුණු බවද සිහිපත් කරන අතර එයට විශේෂ හේතුව වූයේ වත්මන් ආණ්ඩුකාර විලී ගමගේ මැතිතුමා විසින් අප ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ නිසිකලට ලබාදීම තුලින් බව ගෞරවයෙන් සිහිපත් කරමි.තවද අපගේ වැඩකටයුතුවලදී නිරන්තරයෙන් සොයාබලා අපහට උපදෙස්දෙමින් කටයුතු කරන ගරු වැව්ලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා මෙන්ම අප බල ප්‍රදේශය අයත් ආසනයන්හි ගරු සංවිධායකවරුන් වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල ,ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ ඇතුළු හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුන් ,මෙන්ම පළාත් පාලන කොමසාරිස්තුමාට හා එකී ආයතන නිලධාරීන්ටද මෙම සියලු කාර්යයන් ඉටු කිරීමට මා හට ශක්තියක් වූ, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ඇතුළු සියලුම පක්ෂ, විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ට, ගරු මන්ත්‍රීවරියන්ට, මෙන්ම සභාවේ වැඩබලන ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට හා සේවක මණ්ඩලයට ද මාගේ ස්තූතිය පුද කරමින් 2023 වර්ෂයේ මාගේ අයවැය පණිවුඩය නිමා කරමි.

ස්තූතියි !

නිමල් වික්ටර් නාගොඩවිතාන
සභාපති
නාගොඩ ප්‍රාදේශීය සභාව

01.2023 වර්ෂය සඳහා සකස් කරනලද අයවැය වාර්තාව සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, අද සභාපතිතුමාගේ 2023 අයවැය යෝජනාව ඉදිරිපත් කළා. එම යෝජනාව මම ස්ථිර කරනු ලබනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු මන්ත්‍රීවරුනි, මම මගේ පණිවිඩය ඉදිරිපත් කළේ පෙර සේම තමයි. මේ අයවැය සම්බන්දයෙන් කවුරුත් කතා කරන්නෙ, මේ අය වැය යෝජනා ඉටු වෙන්නේ නෑ කියන කතන්දරය. පසුගිය අයවැයවලදී තිබුණු සමහරක් වටින යෝජනා මධ්‍යම ආණ්ඩුව රජය යටතේ කරන්න හැකිවීම පිළිබඳව අපි සතුටු වෙනවා. යම් ප්‍රතිපාදන නොමැති වීම නිසා සියලු යෝජනා ඉටු කරන්න බැරි වුණා. තවදුරටත් මතක් කරන්න ඕන. ක්ෂණිකව අපට දැනගන්න ලැබුණේ වර්තමානයේ ඇතිවී තිබෙන දේශපාලන තත්ත්වය හමුවේ, සභාව විසිරවීමේ හැකියාව අපේ මැතිවරණ කොමසාරිස්තුමා සතුව තිබෙන බැවින්, විසුරුවන්නේ කවදද කියන්න බැහැ. ඉදිරියේදී ඕනම වෙලාවක සභාව විසිරවීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව අපට හැකියාව ලැබුණා. ඉදිරි දිනයකදී අපේ මාපලගම සංවර්ධනය කරන ක්‍රීඩා පිටිය, ළමා උද්‍යානය ජනතා අයිතියට පත්කිරීමට අවස්ථාව සලසා දෙන්න. ඒ වගේම අපට හැකියාවක් ලැබුණේ නැහැ අපේ පෙර පාසල් ළමුන් වෙනුවෙන් යමක් කරන්න. පෙර පාසල් පාලිකාවන් සියලුදෙනාම අපෙන් ඉල්ලුවා, පෙර පාසල් උත්සවය තැන් තැන් වල නොතබා, එකම ස්ථානයක කරන්න අපට උදව් කරන්න කියලා. අපි මාපලගම ක්‍රීඩාංගනයෙ පෙර පාසල් විසිර යාමේ උළෙලත්, සංවර්ධිත ක්‍රීඩා පිටිය විවෘත කිරීම හා සමගාමීව අපේ මුදල් ආයෝජනයක් නොමැතිව වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් මුදල් ලබාගෙන කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අපිට මේ කටයුත්ත කරන්න වටවල වැව්ලි සමාගම ලොකු සහායක් ලබා දුන්නා. ඒ වගේම දෙරණ ආයතනයත් යම් උදව්වක් කරයි. ඒ වගේම ඊයේ දිනයේ දී මහජන බැංකු අධිපති සුජීව රාජපක්ෂ මැතිතුමා කතා කලා. එතුමා ළමයින් වෙනුවෙන් මොනයම් හෝ උදව්වක් කරන්න එකඟ වුණා. ඉදිරි ජනවාරි වල වගේ තමයි අපි කටයුතු කරන්න බලාපොරොත්තු වුණේ. නමුත් ඒක ඉක්මනට 9, 10, 11, 12 වගේ විසුරුවන කතාවක් තමයි තිබුණේ. එනිසා කල් අරගෙන ක්ෂණිකව කතා කරගෙන, මාපලගම ක්‍රීඩාපිටියෙ ඒ කටයුත්ත කරනවා. එම නිසා ලබන 22 දා උත්සවය පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක සභාවට ගෞරවයක් වගේම මන්ත්‍රීවරුන්ටත් ගෞරවයක් වන විදියට ඒ කටයුත්ත කරන්න. මොකද අපි සභා මුදල් වැය කිරීමකින් තොරව තමයි මේ කටයුත්ත කරන්නේ. අපි වෙනදත් සභා අරමුදල් වැය කරමින් තමයි මේ දේවල් කළේ. මම හිතන්නේ අපට සභාවේ ශ්‍රමදායකත්වය පමණයි ලබාදෙන්න කටයුතු කළ යුතු වන්නේ. එසේනම් මගේ අයවැය ඉදිරිපත් කිරීම මෙසේ සනිටුහන් කරමින් මගේ අදහස් දැක්වීම මෙසේ අවසන් කරනු ලබනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයෙන්ද, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන්ද අවසරයි. ගරු විජිත් සහබන්දු මැතිතුමා ස්ථිර කරන ලද 2023 අයවැයට විරුද්ධව අපි ඡන්දය ප්‍රකාශ කරමින් අපි බෙදීමක් ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්න හේතුවත් කියන්නම්. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ සභාවේ අවුරුදු පහකට වැඩි කාලයක් වැඩ කළා කිව්වා. ඇත්තටම අපි ලැජ්ජා වෙනවා, පහුගිය කාලයේදී ඉදිරි ගෙවීම් වාර්ථාවල යම්

යම් අඩුපාඩු පෙන්වලා දුන්නා. මේ සභාවේ වෙච්ච දේවල් දූෂණ වංචා ඉහවහා ගිහිල්ලා තියෙනවා. මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ සභා රැස්වීමේදී අපි හැමදාම මේවා පෙන්වා දෙනවා. පසුගිය කාලයේ මේ සභාවට හොඳ නිලධාරීන් ආවා. පොළේ කටයුතු කරන්න ධනුෂ්ක කියලා මහත්තයෙක් හිටියා. එතුමා හරියට මාසයක්වත් මේ සභාවෙ හිටියෙ නැහැ. හරියට වැඩ කරන කවුරු ආවත් ඉන්න දෙන්නෙ නැහැ. ඊළඟට මේ සභාවෙ පරණ කැබ් එක හත් ලක්ෂ ගණනක් දීලා අළුත්වැඩියා කළා. නමුත් අද උඩුගම උප කාර්යාල භූමියේ ගොඩ ඇදලා තියෙනවා. මේක තුන්ලක්ෂ ගානට අලුත්වැඩියා කරන්න නාගොඩ ලාල් මෝටර්ස් එකෙන් ඇස්තමේන්තු දිලා තියෙන්නෙ. නමුත් හත් ලක්ෂ ගාණකට මේක ඇස්තමේන්තු කරලා ගහගෙන කෑවා. සභාපතිතුමා, මේවා ඔබතුමා දන්නේ නැහැ කියලා කියන්න බැහැ. ඔබතුමා දැනුවත් කරලා තියෙන්නේ, මෙන්න මේ වගේ දූෂණ වංචා තමයි සිදු වෙලා තියෙන්නෙ. ඔය වගේ තව රාශියක් කතා කරන්න තියෙනවා. නමුත් මේ අවස්ථාවේ කතා කරන්න යන්නෙ නැහැ. අපි අයවැයට විරුද්ධයි. බෙදීමක් ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

මම එම යෝජනාව ස්ථිර කරනවා

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ගරු මන්ත්‍රීවරුනි, මේ සභාවේ අයවැයට බෙදීමක් අපේ මන්ත්‍රීවරුන් විසින් ඉල්ලා සිටිනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 අයවැය වාර්තාව ඉදිරිපත් කළ පසුව එයට විරුද්ධවත් ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් යෝජනාව ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඡන්ද විමසීමකට යන්න සිදුවුණා. ඒ අනුව මාගෙන් කළ යෝජනාව විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව, මත දෙකක් තිබෙන නිසා අපි ඡන්ද විමසීමකට යා යුතුයි. එම නිසා පළමුවෙන්ම අයවැයට පක්ෂ මන්ත්‍රීවරුන් අත ඔසවා තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනවා. ඊට පසුව අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන මන්ත්‍රීවරුන් අත ඔසවා විරුද්ධත්වය ප්‍රකාශ කර ලෙසත් ඉල්ලා සිටිනවා. එහෙමනම් අත ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම කරන ලෙස සියලුම සභිකයින්ගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඒ අනුව නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය විසින් ඡන්දය විමසීමේ කටයුතු සිදුකරන ලදී.

**පක්ෂව 16**

| | |
|---|---|
| 1.නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2.එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3.ඊ.ඒ.ඩබ්. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4.එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 5.එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 6.ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 7.සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 8.එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 9.නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 10.සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 11.විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 12.ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 13.එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |

14.එන්.ඩබ්. පතිනායක මහතා ගරු මන්ත්‍රී
15.විජිත් වීරගුණරත්න සහබන්දු මහතා ගරු මන්ත්‍රී
16.ඩබ්. කේ. නෙලී මහත්මිය ගරු මන්ත්‍රිනී

**විපක්ෂ 09**

1. ඩබ්. ජී. නිශාන්ත මහතා ගරු මන්ත්‍රී
2. සී.වී. සහබන්දු මහතා ගරු මන්ත්‍රී
3. එච්.ජී. තරංග සුදර්ශන මහතා ගරු මන්ත්‍රී
4. කුමාරගේ වසන්ත මහතා ගරු මන්ත්‍රී
5. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය ගරු මන්ත්‍රිනී
6. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය ගරු මන්ත්‍රිනී
7. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය ගරු මන්ත්‍රිනී
8. පී.ජී. රංජිත් ජයවීර මහතා ගරු මන්ත්‍රී
9. ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක ගරු මන්ත්‍රිනී

**නොපැමිණි 01**

1. පියල් හිරිමුතුගොඩ මහතා ගරු මන්ත්‍රී

**නොසිටි 01**

1.බන්දුල සමන්ත හිරිමුතුගොඩ ගරු මන්ත්‍රී

**ඒ අනුව ලේකම්තුමිය විසින් කරන ලද 2023 වර්ෂයට අදාලව අය වැය ඡන්ද විමසීමට අනුව පක්ෂව ඡන්ද 16 ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 9 ක් ලැබුණි. ඒ අනුව බහුතර ඡන්දයෙන් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සභා සම්මත විය .**

02. වලකුඹුර ආදාහනාගාරයේ විමිනියේ ඉතිරි වැඩ කර්මාන්තයේ රු. 1,540,000.00 ක බිල්පත පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

03. වර්තමානයේ පවතින තත්වයත්, අප ප්‍රාදේශීය සභාවේ ආදායම් තත්වයත් වර්ධනය කර ගැනීමේ මූලික අරමුණින්, පරණ පත්තර 1 Kg ක විකුණුම් මිළ රු.200.00 දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

04. ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය පිළිබඳ දකුණු පළාත් සැළැස්ම යටතේ වතු අංශයේ පෙර පාසල් දරුවන් සඳහා දියර කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල වතු පෙර පාසල් 11 ක දරුවන් 177 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කෙරිණි. සතියට දින 3 ක් බැගින් නොවැම්බර් හා දෙසැම්බර් මාස 2 කට අදාළව රු. 127,440.00 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

05. පළාත් නිශ්චිත සංවර්ධන සැළැස්ම යටතේ වතු අංශයේ පෙර පාසල් දරුවන් සඳහා පෝෂණීය ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල වතු පෙර පාසල් 11 ක දරුවන් 177 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කෙරිණි. සතියට දින 2 ක් බැගින් නොවැම්බර් හා දෙසැම්බර් මාස 2 කට අදාළව රු. 169,920.00 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධ කර ගනිමින්, අප ප්‍රාදේශීය සභාව යටතේ ඇති පෙර පාසල් දරුවන් 312 දෙනෙකු සඳහා රු. 299,520.00 ක මුදලක් නොවැම්බර් හා දෙසැම්බර් මාස 2 කට අදාළව ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සභා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

07. වළකුඹුර ආදාහනාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබා ගැනීමට අදාළව සකස් කරන ලද රු. 37,137,746.94 ක ඇස්තමේන්තුව අනුව රු. 25,000,000.00 ක ණය මුදලක් ලබා ගැනීමට හා 6.5% වාර්ෂික පොලී ප්‍රතිශතය අනුව මාසික ණය වාරිකය වශයෙන් රු. 283,869.95 ක් අවුරුදු 10 න් ගෙවා අවසන් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

08. වළකුඹුර ආදාහනාගාරයේ චිමිනියේ ඉතිරි වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වන කුරුපනාව එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය විසින් රු. ලක්ෂ 3 ක අත්තිකාරම් මුදලක් ඉල්ලා ඇත. එම අත්තිකාරම් නිදහස් කිරීමට සභා අනුමැතිය ලබා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

**<u>2022.12.13 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>**

**<u>අංක 1-34 දක්වා ඉදිරි ගෙවීම් සහා අරමුදලින් ගෙවීමට සුදුසු බවට යෝජනා කරමි.</u>**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

**I.** 2022 නොවැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **- රු. 81,000.00**

**II.** සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයක් සඳහා SPPF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් ගෙවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම **- රු. 1250.00**

**III.** 2022.11.17 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සහභාගි වු නිලධාරින් වෙත දීමනා ගෙවීම **- රු. 3,500.00**
(රු.500.00 × 7)

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** **- රු. 9,164.66**
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් නොවැම්බර් මස දීමනා ගෙවීම

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල**
2010 වර්ෂය සඳහා හිඟ විගණන ගාස්තු ගෙවීම **- රු. 10,000.00**

**04. ඒ. පී. ජී. නිලූකා මනෝජි උදයංගනී මිය, නිලූ කොමියුනිකේෂන්,වත්තහේන, තල්ගස්වල**
**2023 අයවැය වාර්ථාවේ වර්ණ මුද්‍රණ කටයුතු සඳහා ගෙවීම් කිරීම** **- රු. 7920.00**

**05. සාමාන්‍යාධිකාරී , ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 355, කොළඹ 10** **- රු. 21350.00**
නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම

**06. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල**
නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 දෙසැම්බර් මස බදු කුලිය ගෙවීම **- රු. 6,000.00**

**07. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, අංක 24, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

I. 2022.10.19 දින L- 13814 නඩුවට අදාළව නීතිඥ ගාස්තු, පෙනී සිටීමේ ගාස්තු **-රු. 4,000.00**

II. 2022.10.20 හා 2022.11.03 දිනයන්හි 06553 නඩුවට අදාළව නීතිඥ පෙනී සිටීමේ ගාස්තු හා නඩු වාර්තාවේ පිටපත් ලබා ගැනීම **-රු. 8000.00**

**08. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, සමගිගම, උඩුගම දකුණ, උඩුගම**
2022 **නොවැම්බර්** මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු. 8440.00**

**09. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
2022 නොවැම්බර් මාසය සඳහා නාගොඩ මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම **-රු. 12130.00**

**10.** **බී. ජී. කැළුම් පුෂ්පකුමාර මයා , උඩුගම මෝටර් ඉංජිනියර්ස්, කෙලින් වීදිය, උඩුගම**

**i.** **SPRA 8570 අංක දරණ ට්‍රැක්ටරය සඳහා ඩීසල් ටැප් එකක් අළුතින් දැමීම හා ඩීසල් ටැංකිය ගලවා ශුද්ධ කර නැවත සවි කිරීමේ බිල්පත පියවීම -රු. 4950.00**

**ii.** **SPRA 8570 අංක දරණ ට්‍රැක්ටරයේ හෝන් සවිකිරීමට සහ වයර් පද්ධතිය සාදා රිලේ සවි කිරීමේ බිල්පත පියවීම -රු. 4110.00**

**iii.** SPLL 7103 ටිපර් රථයේ හයිඩ්‍රොලික් හෝස් එක අළුතින් දැමීම සහ හෝන් සෙට් එක සවිකිරීමේ බිල්පත පියවීම **-රු. 13750.00**

**iv.** SPLL 7103 ටිපර් රථයේ සෙන්සරය අළුතින් දමා මයිලෝ මීටරය සෑදීමේ බිල්පත පියවීම **-රු. 22500.00**

**11.** **එන්. ජී. අනුර ශාන්ත මයා, අනුර අයන් වර්ක්ස්, ගෝණදෙණිය, උඩුගම**

i. SPLL 7366 අංක දරණ බවුසරයේ පිටුපස බඟරය අළුතින් දැමීමේ බිල්පත් පියවීම **-රු.4500.00**

ii. ඇප්තොප්වත්තේ කුණු එක්රැස් කරන මධ්‍යස්ථානයේ ඇති විල්බැරෝව අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම **- රු. 650.00**

**12.** **කේ. ටී. ආර්. ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වඳුරඹ**

SPPF 7360 අංක දරණ කැබ් රථයේ වම්පස දුණුකොළ දෙකක් අළුතින් දැමීම සහ දුණු මිටි දෙක හැඩ ගැසීමේ බිල්පත පියවීම **- රු. 26200.00**

**13.** **දයානි ට්‍රේඩ් සෙන්ටර් (පුද්.) සමාගම, මාපලගම, ගාල්ල**

**තණකොළ කපන යන්ත්‍රය සඳහා අවශ්‍ය නූල් මිලදී ගැනීමේ බිල්පත ගෙවීම - රු. 2800.00**

**14.** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, නො.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

SPPF 7360 අංක දරණ කැබ් රථය සඳහා රක්ෂණ සහතිකය ලබා ගැනීම. - රු. **107132.43**

**15.** **අබේනායක ඔටෝ සර්විස්, 30A, වක්වැල්ල පාර, ගාල්ල**

SPPF 7360 අංක දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම **- රු. 47325.00**

**16.** **එම්.ජේ.ජනිත් ඉරේෂ් කුමාර මයා, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහල ලේල්වල, වඳුරඹ**

**2022.11.09 දින පැවති මහා සභා වාරය සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන්ගේ සංග්‍රහ වියදම් පියවීම - රු. 13650.00**

**17.** **පී. එල්. රංජන් මයා, ඇල්බට් ආර්ට්ස්, වැල්බට් ටවුම, ගාල්ල**

**නිලමුද්‍රා සකස් කිරීම වෙනුවෙන් බිල්පත ගෙවීම - රු. 2250.00**

**ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි නිල මුද්‍රාව රු. 1500.00**

**මහජන පුස්තකාලය, උඩුගම නිල මුද්‍රාව රු. 750.00**

**18.** **ජයන්ත ඉලේපෙරුමආරච්චි මයා, ජේ. පී. කොමියුනිකේෂන්, නාගොඩ, ගාල්ල**

**i.** **පී. එස්. 35 වවුචර් 2500 ක් මුද්‍රණය කිරීම සඳහා අදාළ බිල්පත ගෙවීම - රු. 17500.00**

**ii.** **2023 අයවැය වාර්ථාව සකස් කිරීමට අවශ්‍ය මුල් කවරය සහ පිටුපස කවරය ලබා ගැනීමට අදාල බිල්පත ගෙවීම - රු. 2070.00**

**19. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.**

i. 2023 අයවැය වාර්තා පිටපත් 36ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම - රු. **13,641.50**

ii. 2023 අයවැය වාර්තාව සකස් කිරීම සඳහා බයින්ඩින් හා ට්‍රාන්ස්පේපර් ලබා ගැනීම - රු. **1,400.00**

iii. 2022 නොවැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා දුරකතන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත **-රු. 28,500.00**

**20. ජී. එල්. ලක්මාලි මිය, සාරංග ෆුඩ්සිටි, ඇතුමලේ. මාපලගම**

ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සඳහා අවශ්‍ය ඉදල්, කොසු, මන්නා පිහි ලබා ගැනීමේ බිල්පත ගෙවීම **- රු.14360.00**

**21. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයේ කෑම කාමරයේ සින්ක් එකේ ටැප් එක අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත ගෙවීම **- රු. 530.00**

**22. ලංකා තෙල් පිරවුම්හල, නාගොඩ**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත පියවීම - 2022 ඔක්තෝබර්** **- රු. 426,645.00**

| දිනය | වාහන අංකය | ඇණවුම් අංකය | වර්ගය | ප්‍රමාණය (l) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 2022.10.03 | SPPF 7360 කැබ්රථය | 370354 | ඩීසල් | 50 | 21,500.00 |
| 2022.10.07 | | 370358 | | 59 | 25,370.00 |
| 2022.10.10 | | 370359 | | 63 | 27,090.00 |
| 2022.10.14 | | 370364 | | 55 | 23,650.00 |
| 2022.10.18 | | 370366 | | 50 | 20,750.00 |
| 2022.10.20 | | 370370 | | 55 | 22,825.00 |
| 2022.10.24 | | 370371 | | 73 | 30,295.00 |
| 2022.10.27 | | 370374 | | 46 | 19,090.00 |
| 2022.10.29 | | 370375 | | 30 | 12,450.00 |
| 2022.10.31 | | 370377 | | 65 | 26,975.00 |
| | | | **එකතුව** | **546** | **229,995.00** |
| 2022.10.06 | SPLL 7650 කෘ කැබ් රථය | 370356 | ඩීසල් | 30 | 12,900.00 |
| 2022.10.13 | | 370363 | | 35 | 15,050.00 |
| 2022.10.19 | | 370369 | | 25 | 10,375.00 |
| 2022.10.25 | | 370373 | | 35 | 14,525.00 |
| 2022.10.31 | | 370376 | | 20 | 8,300.00 |
| | | | **එකතුව** | **145** | **61,150.00** |
| 2022.10.12 | SPLL 7366 ට්‍රක් ජල බවුසරය | 370360 | ඩීසල් | 20 | 8,600.00 |
| 2022.10.19 | | 370368 | | 50 | 20,750.00 |
| | | | **එකතුව** | **70** | **29,350.00** |
| 2022.10.07 | 252-6478 කැබ් රථය | 370357 | ඩීසල් | 20 | 8,600.00 |
| 2022.10.13 | | 370362 | | 20 | 8,600.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | **එකතුව** | **40** | **17,200.00** |
| 2022.10.06 | SPRA 8570 ට්‍රැක්ටරය | 370355 | ඩීසල් | 40 | 17,200.00 |
| 2022.10.12 | | 370361 | | 20 | 8,600.00 |
| 2022.10.15 | | 370365 | | 30 | 12,900.00 |
| 2022.10.19 | | 370367 | | 40 | 16,600.00 |
| 2022.10.25 | | 370372 | | 40 | 16,600.00 |
| | | | **එකතුව** | **170** | **71,900.00** |
| 2022.10.12 | SPRA 8570 ට්‍රැක්ටරය | 370361 | DS 40 oil | 01 | 1,700.00 |
| 2022.10.25 | | 370372 | | 03 | 5,100.00 |
| | | | **එකතුව** | **04** | **6,800.00** |
| 2022.10.03 | ගබඩා කර තබා ගැනීම සඳහා | 370353 | පෙට්‍රල් | 25 | 10250.00 |
| | | | **එකතුව** | **25** | **10,250.00** |
| | | | **මුළු එකතුව** | | **426,645.00** |

2022.10.18 දින සිට ඉන්ධන මිල සංශෝධනය වේ.

**23. සීගිරි හෝටලය, මාපලගම පාර, නාගොඩ**

නාගොඩ, මාපලගම, උඩුගම පුස්තකාල තුනෙහි පාඨකයින්(ගෘහණියන් වෙනුවෙන්) සඳහා විදාතා මධ්‍යස්ථානයෙන් 2022.11.15 දින පැවැත්වූ ආහාර තාක්ෂණය සම්බන්ධ දේශනයේ සංග්‍රහ වියදම් **- රු. 3000.00**

**24. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම (2022 නොවැම්බර් මස) **- රු. 14500.00**

**25. <u>2022 නොවැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

I. කේ.ඩී.එස්.නිපුනිකා මිය - සංවර්ධන නිලධාරී **- රු. 5980.00**
II. කේ. ජී. ඩී.ඩී. සේනාරත්න - සංවර්ධන නිලධාරී **- රු. 6200.00**
III. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරීක්ෂක **- රු. 4000.00**

**26. <u>2022 දෙසැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතන රාජකාරි සඳහා</u>**

**i.** කේ. කේ. අවන්ත පද්ම මයා - කාර්යාල කාර්ය සහායක - රු. **750.00**
ii. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරීක්ෂක **- රු. 1300.00**

**<u>පුහුණු වැඩසටහන් සඳහා</u>**

i. ඩබ්.ජේ.ඒ. ශානක මයා - ආදායම් පරීක්ෂක **- රු. 2120.00**

**27. <u>2022 නොවැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතන රාජකාරි සඳහා</u>**

i. නිමල් වික්ටර් නාගොඩවිතාන මයා - සභාපති - රු. **3000.00**
ii. කේ. ඩී. එස්. නිපුනිකා මිය - සංවර්ධන නිළධාරී - රු. **2500.00**
iii. එම්. ඒ. වසන්ත මයා - රියදුරු - රු. **4900.00**

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | | |
|---|---|---|---|
| i. | අනුෂා සමරවික්‍රම මිය | - තාක්ෂණ සේවා නිළධාරි | - රු. **1080.00** |
| ii. | කේ. කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.**1180.00** |
| iii. | සදුන් කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු.**1180.00** |

**28. අතිකාල දීමනා ගෙවීම්**

**2022 නොවැම්බර් මස**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | **- රු. 9226.00** |
| කේ.එච්.එම් කැලුම් චාමර මයා | - රියදුරු | **- රු. 1070.00** |
| කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් | - රියදුරු | **- රු. 8,560.00** |
| ඩී.ටී.ආර්.ඒ. තරිඳු ගුණරත්න මයා | - මුරකරු | **- රු. 4,788.00** |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | **- රු. 8,560.00** |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | **- රු. 4,949.00** |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | **-රු. 3,773.00** |
| අයි.කේ. ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1,972.00 |
| යූ.ජී. රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2,870.83 |
| කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | **- රු. 8,080.00** |
| එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | **- රු. 8,453.00** |
| යූ. ජී. ආසිරි අභය කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. **5,656.00** |

**2022 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| කේ. කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. **770.00** |

**පොදු අරමුදල්**

**29.** ඒ. කේ. ජේ. ජී. සංජීව, ගයාන් එන්ටර්ප්‍රයිසස්, මාපලගම පාර, යටලමත්ත

i. කොතේගොඩකන්ද මාර්ගයේ ඒ.කේ. කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිලින්ඩර යොදා සංවර්ධනය කිරීම සඳහා JCB යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 15,000.00

ii. මාර්ග සංවර්ධනය කිරීම සඳහා JCB යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම -රු. 105,000.00

නෙළුවැල් මූකලාන මාර්ගය -රු. 45000.00
හෝමදොළ පාසල අසල මාර්ගය - රු. 60000.00
(සුජාතා මියගේ නිවස දක්වා)

**30.** සී/ ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමුපකාර සමිතිය, පුහුල්දූව, බද්දේගම කැප්පිටියාගොඩ දකුණ දොරණවිල මාර්ගය හරහා ගලා යන ජලය නිසි පරිදි බැහැර කිරීම සඳහා 2'x8' හියුම් පයිප්ප 02 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 48,650.00

**31.** එන්. ජී. අනුර ශාන්ත මයා, අනුර අයන් වර්ක්ස්, ගෝනදෙණිය, උඩුගම කැප්පිටියාගොඩ - උඩවැලිවිටිය පාලමේ යකඩ බට පැස්සීම වෙනුවෙන් ගෙවීම - රු. 2,000.00

**32.** දයානි ට්‍රේඩ් සෙන්ටර් (පුද්.) සමාගම, මාපලගම, ගාල්ල
උඩුගම සතිපොළ කඩකාමර සැකසීම III අදියර සඳහා සිමෙන්ති කොට්ට 08 ක් ලබා ගැනිමේ බිල්පත පියවීම - රු. 24,800.00

රජයේ ආධාර

2021 පළාත් නිශ්චිත

**33.** එකමුතු ජොෂ්ඨ පුරවැසි සංවිධානය, කුරුපනාව

කොළඹගෙදර කුඩමලාන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම - රු. 99,154.41

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 991544.14
ගෙවා ඇති මුදල - රු. (892389.72)
ගෙවිය යුතු 10% රැඳවුම් මුදල -රු. 99154.41

**34. යටලමත්ත ශ්‍රී සුමංගලාරාම ජොෂ්ඨ පුරවැසි සමිතිය, යටලමත්ත**

**බරවාමුල්ල මයියොක්කාහේන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම -රු. 49,290.95**

ගෙවීමට නිර්දේශිත මුලු මුදල - රු. 492909.53
ගෙවා ඇති මුදල - රු. (443618.58)
ගෙවිය යුතු 10% රැඳවුම් මුදල -රු. 49290.95

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් අංක 1 – 34 දක්වා ඇති ඉදිරි ගෙවීම් වලින් 32 ඉදිරි ගෙවීම හැර ඉතිරි ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු උප සභාපතිතුමා සහ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

10. පුහුල්හේන අම්බලන්ගොඩ හේන මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම , කොරිපස් යෙදීම, කැටගල් යෙදීම

**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

11. අකුලහේන උපුල් මහතාගේ නිවස දෙසට මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

12. අකුලහේන සඳසිරි මහතාගේ නිවස දෙසට මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

13. අකුලහේන ධර්මදූත මධ්‍යස්ථාන මාර්ගය ජේ.සී.බී යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

14. උඩලමත්ත කොට්ඨාසයේ අවශ්‍ය ස්ථානවලට වීථි පහන් සවි කිරීම

**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

15. උඩුගම් ඉහළ දමා ඇති යකඩ පාලම (ඉවත් කරන ලද) බණ්ඩාරනායකපුර කිරි මධ්‍යස්ථාන පාර දොලට යෙදීම
**ගරු උපසභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**
16. මාපලගම මධ්‍යම පදිංචි රුවිනි නදීකා නාගොඩවිතාන මහත්මිය මාසික දීමනාවකින් තොරව මාපලගම මහජන පුස්තකාලයේ පුහුණු වීමට ඉඩ සලසා දීම සුදුසු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**
17. 214 ඒ මලාමුර ග්‍රාම නිලධාරී වසමට අයත් සෞඛ්‍ය කාර්යාලය අසළ සිංහගිරිය මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් කාණු කපා බෝක්කු දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය .**

**11-8** යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා
18. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හය (6) දෙනෙක් සඳහා රු. 3000.00 බැගින් රු. 18000.00 ක් ආහාර නිදර්ශක ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

19. දෛනික වැටුප් ලබන සේවක මහත්ම මහත්මීන් දහ දෙනෙක් (10) සඳහා 2022 දීමනා මගින් අනුමත වූ රු. 5000.00 , 2022 ජනවාරි මස සිට හිඟද සමඟ ගෙවීම. හෝ/හා 2023.01.01 සිට එම දීමනාව ගෙවීම සඳහා අනුමැතියට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

20. සුළු මුදල් අත්තිකාරම රු. 5000.00 හා සංග්‍රහ වියදම් අත්තිකාරම රු. 4000.00 ලබා දීම සඳහා අනුමැතියට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

21. වර්තමානයේ ඇතිව ඇති උග්‍ර ආර්ථික අර්බුධය හමුවේ අපහසුතාවයට පත්ව ඇති සභාව මගින් පාලනය වන පෙරපාසල්වල ඉගෙනුම ලබා පළමු ශ්‍රේණියට ඇතුලත් වන ළමුන්ට නොමිලේ අභ්‍යාස පොත් ලබාදීමට සහ බල ප්‍රදේශයේ හඳුනාගත් අඩු ආදායම්ලාභී පාසල් ළමුන් සඳහා නොමිලේ පොත් කට්ටලයක් ලබාදීමට

සහා අරමුදලෙන් රු. ලක්ෂ 20 මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කිරීමට යෝජනා කරමි. (ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වාර්තාව අනුව ළමුන් තෝරා ගැනේ.)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

22. 2023 වර්ෂය සඳහා අප ආයතනය වෙත භාණ්ඩ, සේවා හා වැඩ මිළදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන සැළැස්ම සහා අනුමැතිය සඳහා යොමු කිරීමට ඉදිරිපත් කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

23. නාගොඩ ප්‍රාදේශීය සභාව යටතේ ඇති පෙරපාසල් 14ක දරුවන් 2023 වසරේ පෙර පාසලට ඇතුලත්වීමේදී නිල ඇඳුම් ලබාදීමට රු. 350,000.00 ක මුදලක් සහා අරමුදලින් වැය දැරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

24.දැනට සභාවේ අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන පහත නම් සඳහන් සේවකයන්ගේ වාර්ෂික සේවා කාලය අවසන් වී ඇති බැවින් ආයතනික අවශ්‍යතාවය මත එම සේවකයන්ගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය.**

25. නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

26.2023 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

27.පරණතානායම්ගොඩ කොට්ඨාසයේ කපල්විල ප්‍රදේශයට අයත් සභාව විසින් ඉදිකරන ලද ප්‍රජා ශාලාව මේ වන විට පස් කණ්ඩියක් කඩා වැටී එහි බිත්තියක් සහ වහලේ ෂීට් ගැලවී දිරාපත් වෙමින් පවතින බවත්, එය ප්‍රදේශයට විශාල සම්පතක් බැවින්, එය නැවත පිළිසකර කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිරකරනු ලදුව ඒකමතිකව සභාසම්මත විය .**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. තුන්හවුල් කැල්ල මහගෙදරවත්ත පාර සංවර්ධනය කිරීම - රු. 200,000.00

ii. 216 ඒ නාගොඩ ඉහළ ග්‍රාම සේවා වසමේ අන්නාසිගලහේන කොටසේ ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිට ශාන්ත මහතාගේ නිවස අසළ දක්වා මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම සහ ගල් බැම්මක් ඉදිකිරීම - රු. 500,000.00

iii. 216 ඒ නාගොඩ ඉහළ අන්නාසිගලහේන මුලන මාර්ගයේ සිට හිරිමුතුගොඩ කඩය අසළ ප්‍රධාන මාර්ගය යාවන පාර අන්නාසිගලහේන මාර්ගයෙන් ගලවා ඉවත් කරන කැටගල් අතුරා සංවර්ධනය කිරීම - රු. 160,000.00

iv. 216 ඒ නාගොඩ ඉහළ කුරුන්ද ලියන මහතාගේ කඩය ඉදිරිපිටින් ඇරඹී කළුගල අසලින් ප්‍රධාන පාරට යාවන අතුරු මාර්ගයේ මුල් කොටසපාර අන්නාසිගලහේන මාර්ගයෙන් ගලවා ඉවත් කරන කැටගල් අතුරා සංවර්ධනය කිරීම - රු. 200,000.00

v. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශයේ සිවිලිම සකස් කිරීම- රු. 70,000.00

vi. LL 7366 බවුසර් රථය අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුව - රු. 37,400.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ) 4. මිළ ගණන් ඉදිරිපත් කිරීම

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.11.30 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

02.2022.11.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

**ඉහත සඳහන් ප්‍රසම්පාදන කමිටු වාර්තාව හා මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සත්‍ය වාර්තා ලෙස ගරු මන්ත්‍රිනී ප්‍රියංගිකා දිල්රුක්ෂි මහත්මිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

01. 2022 ඔක්තෝම්බර් ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභාගත කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු සභාපතිතුමා**

ඒ අනුව වැඩි ඡන්ද 7කින් 2023 නාගොඩ ප්‍රාදේශීය සභා අය වැය සම්මත වී තිබෙනවා. ඒ අනුව අයවැයට පක්ෂව ඡන්දය ලබාදී තිබු මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂව ලබාදුන් මන්ත්‍රීවරුන්ටත් මම බොහොම ස්තුතිවන්ත වෙනවා. මම දන්නවා විපක්ෂව ඡන්ද දුන්නේ එතුමන්ලා විපක්ෂව නෙවෙයි. මේකේ විපක්ෂව ඡන්දය දෙන්නෙ එකම එක මන්ත්‍රීවරයෙක් වන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා පමණයි. එතුමන්ලගෙ ක්‍රමවේදය තුළ, එතුමන්ලා විපක්ෂය ලෙස විරුද්ධ වෙන එක මිසක්, කවදාවත්ම සහය දක්වන්නෙ නැහැ. හරි වැරදි කොහොම වුණත් එකයි. ඊළඟට අපේ වසන්ත මන්ත්‍රීතුමාගේ තියෙන්නේ වෙනත් මතවාදයක්.

ඒකයි. නැත්නම් අනෙක් මන්ත්‍රීවරු මම දන්නවා හිතින් හරි මා සමග ඉන්න බව. ඒ වගේම අයවැය විවාදය සඳහා ඔබතුමන්ලට අවස්ථාව ලබා දෙනවා. ඒවගේම මම ආරාධනා කර සිටිනවා, විපක්ෂව ඡන්දය ඉදිරිපත් කළ රංජිත් ජයවීර මන්ත්‍රීතුමාට අදහස් ප්‍රකාශ කරන ලෙස.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මුලින්ම කියන්ඩ ඕන, ඔබතුමා කිව්වා අපේ පක්ෂය හැමදේකටම විරුද්ධ වෙනවා කියලා. නැහැ සභාපතිතුමනි, හොඳ දේට හොඳයි කියනවා. නරක දේට නරකයි කියනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මීට ඉස්සර අවුරුදු 3-4 ක් ඉවරයි. දැන් මේ 5 වෙනි අවුරුද්ද යන්නේ. මේ අයවැයට පක්ෂව දෙන්න බැහැනේ. මගේ ළඟ තියෙනවා ඇස්තමේන්තුවක්. මේ තියෙන්නේ නොම්මර 20 කුඹුරුහේන මාර්ගය පිළිසකර කිරීම රුපියල් 50000.00, මේකට ගිහින් දැන්මෙ කැඩිච්ච සිළිංඩර් දෙකක්. අඩි හතර සිළිංඩරයෙන් අඩි දෙකක් ම කැඩිලා තියෙන්නේ. පාර මැද ඒ වල තියෙන්නේ. මුලින්ම මම මේ යෝජනාව ගෙනාපු වෙලාවේ මම කිව්වා හරියට වැඩේ කරන්න කියලා. තාක්ෂණ නිලධාරී කෙනෙක් යැව්වා කිව්වා. බැලුව කිව්වා. ඒ වගේම නිලධාරීන්ට කිව්වා, ඒ කිසිම කෙනෙක් බැලුවෙ නැහැ. සියලුම වරප්‍රසාද ටික දීලා රුපියල් 50,000.00 කට මොකක්ද කළේ, කානුවේ තියෙන පස් ටික උඩට දැම්මා විතරයි. දැන් අන්න ඒ බෝක්කුව කැඩිලා. එදා බද්දේගමින් ගේනකොට මම කිව්වා, අන්න පුපුරලා තියෙනවා, ගිහින් බලන්න කියලා. පුපුරපු කැඩිච්ච සිළිංඩර් ටික දැම්මේ, අනෙක් ටික එහෙමම අරන් ගියා. එවිට මම ඇහුවා දැන් ඩීසල් ටික පිච්චෙන්නෙ නැද්ද කියලා, ඒවට කිසිම උත්තරයක් නැහැ. අන්න ඒක තමයි මම කියන්නේ, ඔය අයවැය අනුමත කලාට කරන්නේ එවැනි දේවල්. ඒක හරිද වැරදිද, ගරු සභාව තමයි ඔබතුමාලා අත්සන් කරපු, තාක්ෂණ නිලධාරී නිර්දේශ කරපු, ඇස්තමේන්තුවල ඔන්න ඕකයි තත්වය. මේවට අපි අත උස්සලා මිනිස්සුන්ගේ බදු සල්ලි ටික නේ අපි විනාශ කරලා තියෙන්නේ.

අපේ තරංග සුදර්ශන මහතා පෙන්නුම් කරල දුන්නා, අර පොළේ කොන්ක්‍රීට් කරපු හැටි. කණු හිටවපු හැටි දැක්කනෙ. ඔන්න සල්ලි නාස්තිය. තල්ගස්වල පොළෙත් කළේ ඒකමයි. කොන්ක්‍රීට් දානවා කියලා උඩින් පස් ටිකක් දාලා, ගල් ටිකක් දාලා, උඩින් කොලපු ටිකක් දැම්මා. මම ඒක පෙන්නුවා. ඔන්න ඕවා වැරදි. ඔන්න ඕවා තමයි දූෂණ වංචා කියන්නේ. ඔන්න ඔහොම තමයි දැන් ඕව පෙන්වල දෙන නිසා කියනවා, ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වෙනවලු. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ වැරදි පෙන්වල දෙන එක, අපට ඕවා දැක දැක කොන්දක් තියාගෙන අපට ඕවා කරන්න බැහැ සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඒ අවස්ථාවේදී මට ඔබතුමාලා දැනුවත් කළා නම්, මම නිලධාරීන් සුදනො කරන්න යන්නේ නැහැ. නිලධාරීන්ගේ වැරදි අපට කියන්න ඕන. ඔබතුමාලා නිලධාරීන්ගෙ වැරදි ඒ දැකපු අවස්ථාවෙම අපට පෙන්වලා දෙන්න ඕන.ඒක ඔබතුමාලගෙ වගකීමක්.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ඇත්තටම අපට කණගාටුයි සභාපතිතුමනි, පොලේ යකඩ දොරවල් ටික කඩන් ගිහිල්ලා. මම මේ සභාවෙ කී පාරක් කිව්වද? මොනවද කළේ? මොනවත් නැහැ. විදුලි කාමරේ මාරාන්තික තැනක් තියෙනවා. මොනවත් ආරක්ෂක වැඩපිළිවෙළක් කරල නැහැ. අපේ බදු සල්ලි ටිකෙන්නේ ඔය ටික කරන්නේ කෝ මේවට විසඳුම්. ඇත්තටම මන්ත්‍රීවරුනි, මට කණගාටුයි. මොකද මට අසාධාරණය පේන්න බැහැ. දැන් මේ මන්ත්‍රීවරුන්ට මොකද වෙලා තියෙන්නේ මළ ගෙදරකට යන්න පුලුවන්ද? බැහැනේ, මොනවද ගිහිල්ලා කතා කරන්නේ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

ඇයි අපට යන්න බැරි. අපි ඕන තරම් මළ ගෙවල්වල යනවා. ගරු මන්ත්‍රීතුමා අපට නම් ඔහොම ප්‍රශ්නයක් වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

පාසල් වල උදේ රැස්වීම තියන්නේ නැහැ. දරුවෝ කලන්තෙ දාලා වැටෙනවා. ඇයි මන්දපෝෂණය. පාන් කෑල්ලක් වත් දැන් කන්න පුලුවන්ද? බත් නැහැ. බත් කන්න පොහොර ටිකත් නැති කලානේ. අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා දන්නවා. කෝ අපට පොහොර ටික, අපිත් කුඹුරු කරලා තියෙනවා. ගරු සභාපතිතුමා මුළු දවසක් මදි මේ දේවල් සම්බන්ධව කතා කරන්න. අපේ කාලවේලාව යනවා. ඇත්තටම මේ දරුවොන්ගෙ පොත් ටික දෙනවා නම් හොඳයි. මොකද දැන් මිනිස්සු ඉතාමත් අසරණ වෙලා ඉන්නෙ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ඔබතුමාලා විරුද්ධ වුණානේ මන්ත්‍රීවරුනි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

නැහැ, අපි විරුද්ධ නැහැ. පුළුවන්නම් දෙන්න. නමුත් අපි දන්නවා මේක කරන්න බැරි බව. අපේ මේ ජනතාවගෙන් ගන්න බදු මුදල් ටිකට හරියාකාරව වැඩක් කරන්න කියලා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. කොහොමත් තව මාස තුනක් වගේ ඉන්න තියෙන්නේ. ඒ මාස තුනේදී වත් සාර්ථකව මේ ගමන යන්න සැම දෙනාම එකතුවෙලා ජයග්‍රහණය මිනිසුන්ට ලබා දෙන්න යැයි කියමින් මගේ කතාව අවසන් කරනු ලබනවා.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ඇත්තටම හිතට එකඟව නෙවෙයි ඔබතුමාට ඡන්දය ප්‍රකාශ කළේ. කාන්තාව වෙනුවෙනුත් ඇත්තටම අපට සහයෝගයක් තිබුණෙ නැහැ. යන මොහොතේ අන්තිමට මනුස්සකම කියලා එකක් තියෙනවා. අවුරුදු හතරක් ගිහිල්ලා කිසිම ඉල්ලීමක්, යෝජනාවක් ඉටු කළේ නැති වුණාට, අපි යුතුකමක් හැටියට ඡන්දය ප්‍රකාශ කළා. මම හිතන්නේ අයවැයට විරුද්ධ වුණයි කියලා ප්‍රශ්නයකුත් නැහැ. පක්ෂ වුනයි කියල ප්‍රශ්නයකුත් නැහැ. මොකද මේ විසි හත් දෙනාම අවුරුදු හතරක් තුළ වාද විවාද කරගෙන කටයුතු කළා. අපේ සභාපතිතුමා හිතන්නේ නැතුව කරන දේවල් නිසා තමයි ගැටලු ඇති වෙන්නේ. එතුමට නිලධාරීන් ටිකගෙනුත් මුල ඉඳළම වෙච්ච වැරදි නිසා තමයි මෙහෙම වෙලා තියෙන්නේ. දැන් ඒවා හදන්න බැහැ. මම එතුමාට සහයෝගය දැක්වූයේ පෙර සිටම තිබූ මිත්‍රශීලී භාවය නිසා, පක්ෂය ගැන හිතලා නෙවෙයි දුන්නෙ. ලබන්නාවූ ඉතිරි මාස දෙක තුනේදිවත් මෙතුමා හරියට වැඩක් කරාවි කියලා බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා පස්වෙනි අවුරුද්දටත් ජයග්‍රහණය කළා. අපි අපේ පරාජය අනාගතයේ දී ජයග්‍රහණයකට පෙරලා ගන්නවා. ඒ ආදර්ශය අපේ රටේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්තයා පෙන්වල දීල තියෙනවා. පරාජය හෙට දිනයේ දී ජයග්‍රහණයක් කරා යන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

ඒ වගේම මේ වෙලාවේ නාගොඩ ප්‍රාදේශිය සභාව ගත්තම, විශේෂයෙන්ම මගේ ගෞරවය කණ්ඩායමක් හැටියට එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම, මේ අවුරුදු පහ තුලම කිසිදු බෙදීමකින් තොරව, අපේ වනමල් මන්ත්‍රීතුමා වෙන පැත්තකට ගියත්, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් බෙදීමකින් තොරව පස්වෙනි අවුරුද්දටත් එකට හිටගන්න හොඳ කොන්දක් තියෙන පස් දෙනෙක් ප්‍රාදේශීය සභාවට තෝරලා එවලා

තියෙනවා. ඒ නිසා කවුරු පත් වුණත් ඒ ශක්තිය අපට තියෙනවා. ඒ නිසා අපි ආඩම්බර වෙනවා. අපි එක්සත් ජාතික පක්ෂය වශයෙන් ඒ පිළිබඳව කතා කරන්න යන්නෙ නැහැ. මම හිතන්නේ මේ සභාවේ තව මාස දෙකකින්, මාස හැටක් ඉඳලා තියෙනවා. මේ කාල වකවානුව තුල කොටි 2 කට වැඩි ආසන්න මුදලක් අපි දීමනා ලෙස ලබාගෙන තියෙනවා. අපට බය නැතුව අයවැයට අත උස්සන්න බැහැ. අපට බැරිවුණා වීදි ලාම්පුවක් දාගන්න, එක සිළිංඩර් කටක් ගන්න අපට බැරි වුණා. මෙහි මාර්ග පද්ධතියක් තියෙනවා. ප්‍රාදේශීය සභා එක පාරක වැඩ අවසන් කරලා තියෙනවද කියලා මට පුළුවන්නම් කියන්න. එකපාරක වැඩ ඉවර කරලා නැහැ. එහෙම කරලා තිබුනනම්, මම පෞද්ගලිකව අත උස්සනවා. මට දේශපාලනය අවශ්‍ය නැහැ.

කිසිම දෙයක් නැතුව අපි කොළ පුරවල දීලා තියෙනවා අතිකාල දීමනා, ඒ වගේම අපේ වැටුප අපි අත්සන් කරනවා. කෝටි දෙකෝටි ගානක් ගෙන අපි ගමට වැඩක් කරන්න ඕන. තමුන්නාන්සේලාටත් බැරිවුණා. පතිනායක මන්ත්‍රීතුමා ඇවිල්ලා වාඩි වුනේ ජනාකීර්ණ ජනතාවක් ඉන්න ප්‍රදේශයක් නියෝජනය කරමින්. තමුන්නාන්සේ ඇත්තටම අද අත උස්සපු එක ගැන අපි කණගාටු වෙනවා. පස්වෙනි අවුරුද්දටත් අඩිය තියලා, කෙසෙල් ගස් හිටුවලා තියෙනවා, කැන කපන්නත් ළඟයි, හෙට අනිද්ද ඉන්දපු මිනිහා කැන කපාගෙන යාවි. ලැජ්ජයි මේක සභාවට කියන්න. පාරවල් කැඩිලා තියෙනවා, ජීවිත හානි වෙන්න තියෙනවා, බොක්කු ටිකක් දාගන්න බැරිවෙලා තියෙනවා. එහෙමනම් අපි ඇවිල්ලා, අපි අත උස්සනවා. මල ගෙවල් වල ගියාට, කතා කලාට, හිතන්න එපා සභාපතිතුමා, අපිත් ඔය තියරිය කරල තියෙනවා. අපිත් වැඩ කරල තියෙනවා. මම නියෝග කරනවා , වැඩ කරලා තියෙන ඒවා මොනවද කියන්න කියලා. තමුන්නාන්සේලාගේ 15 දෙනාම තියෙන හිතවත්කම් වලට අත ඉස්සුවට, ඔය 15 දෙනාගෙම එක වැඩක් ඉවර වෙලා තියෙනවද කියලා. විදුහල්පතිතුමාගේ අභියෝග ඇවිල්ල තියෙනවා. මම දැනුවත්ව අපේ වෙරංග මන්ත්‍රීතුමාගේ යෝජනාවක් ඇවිල්ල තියෙනවා. එතුමාගේ තිඹිරි ගහ කපන්න, ඒ වගේ යෝජනා කරන්නෙ, මම හිතන්නේ අවුරුද්දක් ගියා, කොන්ත්‍රාත්තුවක් ගත්තම තියෙන්නෙ ඒ වැඩේ ඉවර කරන්න. ආදාහනාගාර මාර්ගය සම්බන්ධයෙන් මම අභියෝග කලා, සති දෙකක් දෙන්න, තාර දාලා, කාපට් කරලා, නෙවෙයි වාහනයක් යන්න පුළුවන් තත්වයට හදන්න කියලා, සති දෙකකින් මම ඔය පාර හදනවා කියලා. මේකේ නිලධාරී ඉන්නවා. මම දකින දෙය තමයි, අපට ප්‍රායෝගිකව තිබෙන දැනුම ඒ මිනිස්සුන්ට නැහැ.

ඊළඟට උඩුගම ගැන කතා කරනවා නම්, පහුගිය දවස්වල අපි උඩුගමට ගියා. කුණු බක්කි පේලියක් තියලා තියෙනවා. සභාවේ උප සභාපතිතුමා, ලේකම්තුමිය ගියා. පණුවො දාපු පෙට්ටි හතරක් තියෙනවා පේලියට තියලා. තමුන්නාන්සේලා රුපියල් පන්දාහක් දෙන්න යෝජනා කරනවා. තමුන්නාන්සේලා අතිකාල දෙන්න යෝජනා කරනවා. පෙට්ටි හතරෙ පනුවෝ දාලා උපකාර්යාලෙ පුස්තකාලය පිටිපස්සේ, එක් කම්කරුවෙක් නැති වුණා. ඒකෙ කිසිම නිලධාරියෙක් උපදෙස් දෙන්න නැති වුණා. ප්‍රාදේශීය සභාවෙ පුස්තකාලය කියන්නෙ, අහිංසක දරුවෝ එන තැන. මෙතන කවුරුත් ඇහුවේ නෑ පෙට්ටි වල පනුවෝ දාලා නේද කියලා. මේකද පරිපාලනය කියන්නේ. කාර්ය මණ්ඩලය පුටුවක් ගානේ ඉන්නවා. එදා ටික දෙනයි නිලධාරීන් හා මහජන නියෝජිතයො හිටියේ. ඒ කටයුතු හරියට කළා. එදත් ග්‍රාම නිලධාරී වසම් 53යි. අදත් 53 යි. අපි ටික දෙනා හරියට වැඩ ටික කළා. අද දුකයි, කණගාටුයි. ඇප්තොප්වත්තෙ හොඳ බංගලාවක් තියෙනවා. අද ඇඳුමක් ඇඳගෙන යන්න බැහැ. කුණු ගොඩක්. මම සභාවෙන් අයින් වෙන කොට සභාවෙ හිටියෙ අජිත් එඩේරආරච්චි මැතිතුමා. එතුමට හොඳ යතුරු කැරැල්ලක් මම මෙතන තියලා ගියා ඒ ගරුත්වය තියලා. හොඳ බංගලාවක් හැටියට බාර ගත්තෙ එදා. ඒකෙ අඩුපාඩුවක් කියන්න තිබුණෙ නැහැ. සේරම කාමර කවුරු හරි ආවොත් ඉන්න පුළුවන් තත්ත්වයක තිබුණා. අද එතන පණුවකුට ඉන්න බැහැ. සභාපතිතුමා, මේක ද පරිපාලනය කියන්නේ.

කොම්පෝස්ට් කියලා එකක් තියෙනවා. නිෂ්පාදනයක් නැහැ. අයවැයක් නැහැ. මේ සභාවේ පුලුවන්නම් ඉදිරිපත් කරපු එක් අයවැයක් කියන්න (කොම්පෝස්ට් පොහොර සම්බන්ධව) කොම්පෝස්ට් වලින් ආදායම මෙච්චරයි. පොල් ආදායම මෙච්චරයි. එහෙම දෙයක් ඉදිරිපත් වෙලා නෑ. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ

පාලනය ගැන ඇත්තටම අපි කණගාටු වෙන්න ඕන. මේ සම්බන්ධව සභාපතිවරයාට මම ඇඟිල්ල දික් කරන්නේ නැහැ. කාර්ය මණ්ඩලයක් ඉන්නවා, පුටුවක් ගානේ වාඩිවෙලා ඉන්නවා. අපි කෝටි තුනක් ගන්නකොට, මෙයාලා නම කෝටියක් අරගෙන ඇති. මේ සභාවේ රජයේ සල්ලි, අහිංසක දුප්පතාගේ පාන් කාලේ සල්ලි. අන්න ඒවා ගැන කල්පනා කරන විට මොනවද මේ ප්‍රදේශයේ වෙලා තියෙන්නෙ කියලා මම අහනවා. බෝක්කු කටක් දාන්න කිව්වම, ඒක හරියට කරන්නෙ නැහැ. ඌරල පාලම් ඇන්ද කැඩිලා, පක්ෂ විපක්ෂ භේදයෙන් නෙවෙයි මම මේ කතා කරන්නේ. පතිනායක මන්ත්‍රීවරයා කියපු පාලම් ඇන්ද, ලැජ්ජයි. අද තව වෙනකම් ඒ පාලම් ඇන්ද සවි කරගන්න බැරි වුණා. සමස්තයක් ලෙස ගත්තම, මුළු සභා පද්ධතියම කඩාවැටීමට ලක්වෙලා කියලා කියන්න පුළුවන්. මම කතාව මීට වඩා දීර්ඝ කරන්න යන්නේ නැහැ. ඒක ඔබතුමාගේ දුර්වල පාලනය නිසා සිද්ධ වෙලා කියලා මම කියනවා. ඒකයි සිද්ධ වෙලා තියෙන්නෙ. ඇත්තටම තමුන්නාන්සේලාට වගකියන්න සිද්ධ වෙලා තියෙන්නේ. කම්කරු මහත්තරු මගේ ඉදිරියට අහුවෙනවා. අපි කාර්යාල නිලධාරීන් අල්ලගෙන කෑ ගහනවා. එයාලට බනිනවා. ඒක නෙමේ ප්‍රශ්නේ, එතනත් එකයි, මෙතනත් එකයි. ආවට වැඩක් නැහැ. හරියාකාරව බොහොම සීමිත පිරිසකගෙන් වැඩ කෙරෙනවා. ඒ අයට අපගේ ගෞරවය දක්වනවා. අපි යම්කිසි සීමිත පිරිසකගේ කැපවීම, දක්ෂතාවය මත කටයුතු කරගෙන යනවා. ඇත්තටම මම සතුටු වෙනවා ලේකම්තුමිය යම්කිසි වැඩපිළිවෙළකට කටයුතු අරගෙන යනවා. ඒ වැඩපිළිවෙල කරන්න, කවුරුවත් ඉඩ දෙනවා නොදෙනවා මම දන්නෙ නැහැ. මම කාගෙවත් සුදු හුණු ගාන පුද්ගලයෙක් නෙවෙයි. එතුමිය ඇහුම්කන් දෙනවා. එතුමියට කරන්න පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් එම වැඩ කොටස කරනවා. අපි ඒකට ගෞරව කරනවා. වෙනදා වගේ අතහැරල තිබුණ නම් මේ ටිකවත් කෙරෙන්නේ නැහැ. මම කෙටියෙන් විග්‍රහ කළේ. අඩුපාඩුවක් වුනා නම් සමාවෙන්න. කෝටි තුනක් අපේ ගිණුම් වලට එනකොට, අපේ 27 දෙනාගේ ඒ විදිහට දීමනා එනකොට ටිකක් කල්පනා කරලා බලන්න. අපි ගමට කරපු දේ මොකද්ද? මේ කෝටි 3 අපි 27 දෙනා බෙදාගන්නකොට අහිංසක දරුවකුට කරපු දේ මොකක්ද කියන එක පිළිබඳවත් මතක් කරමින්, පොළ සම්බන්ධයෙන් මෙතුමා කතා කළා. බලන්න කොච්චර ලැජ්ජයිද කියලා. පරීක්ෂණයක් අවශ්‍යයි. ඒ දීමනා යම්කිසි විදිහකින් ගෙවලා තිබෙනව නම්, කරුණාකරලා ඒ නිලධාරීන්ගෙන් අය කරගන්න. නැත්නම් මේ මන්ත්‍රීවරුන් ඒ දේවල් පෙන්වා දීමේ ප්‍රතිඵලයක් ඇත්තෙ නැහැ. මේ මොහොත වන විට තරංග මන්ත්‍රීතුමා ලිඛිතව දීලා තියෙනවා. පරීක්ෂණයක් අවශ්‍යයි. ඒ පරීක්ෂණ වාර්තාව සභාවට ඉදිරිපත් කරන්න. තමන්ගේ කොට්ඨාසයේ වැඩක් කෙරෙනවා නම් හෙට ඉඳලා කොට්ඨාස මන්ත්‍රීවරු අධීක්ෂණයට දාන්න, ඉතිහාසෙ අපි එහෙමයි කළේ. -------මන්ත්‍රීවරු මෙතැනට ඇවිල්ලා කතා කරනකොට, ඔබතුමාලට කොට්ඨාශ භාර දීල තියෙන්නෙ, මෙතැන ප්‍රශ්න කරන්නේ අපි කියලා කියන්න. අවසාන වශයෙන් කියනවා තවත් අයවැයක් අතිරේඛ ඉදිරිපත් කරනවා. හතර අවුරුද්දකට වැඩ අවසන් කරලා ඉවර වෙන්නෙ නැත්තම් මේ අවුරුද්දටත් ඉදිරිපත් කළා. තමන්ගේ කෙනා නේද කියලා දෙනවා. ඒක දෙන්න ඕන. නමුත් එක්සත් ජාතික පක්ෂයයි, පොදුජන පෙරමුණයි, අපේ ජනාධිපතිවරයෙක් සිටියත් අපේ ජනතාව ගැන හිතලා, අපි විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා. ඒකට අපි ගරු කරනවා. අද මේ මොහොත වෙනකොට අවසාන වශයෙන් කියන්න ලැජ්ජයි නමුත් අද රටේ දරුවන් කොතරම් බඩගින්නෙ ඉන්නවද? මේ සභා කාලය තව දික් කළොත් සංවර්ධනය නොවෙයි, ප්‍රදේශයේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ කුසගින්න නිවන්න බඩුමල්ලක් බෙදන්න මම යෝජනා කරනවා. ඒක පාට පක්ෂ බේද නැතුව සිදු කරන මෙන් ඉල්ලා සිටිමින්, රනිල් වික්‍රමසිංහ මහතා උපක්‍රමශීලීව ඉදිරියේදී රට ගොඩ දමාවි කියලා බලාපොරොත්තු වෙමින්, හැමදෙනාගෙන්ම ඒකට ශක්තියක් වෙමු කියලා ඉල්ලා සිටිමින්, තමුන්නාන්සේලාගෙ හෙට දවස ජයග්‍රාහි දිනයක් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මේ වෙලාවේ මම විශේෂයෙන්ම අදහසක් ප්‍රකාශ කරන්න කැමති වුනේ, මම සහ අපේ පක්ෂයේ අය අයවැයට ඡන්දය දෙන්න

තීරණය කරපු නිසා. සමහර විට සහබන්දු මන්ත්‍රීතුමාගේ කතාවෙනුත් පිළිබිඹු වුණේ, ඇයි අපි ඡන්දය දුන්නේ නැත්තේ කියන කාරණයයි. විශේෂයෙන් ප්‍රධාන කාරණා දෙකක් යටතේ ඡන්දය දෙන්න තීරණය කළේ. එකක් අපේ පක්ෂයේ බන්දුල මන්ත්‍රීතුමා, නෙලී මන්ත්‍රීතුමියත්, අපිත් පක්ෂයක් ලෙස සහබන්දු මහත්තයා කිව්ව වගේම, ගත්තු තීන්දු තීරණ පක්ෂයක් හැටියට එකට ගත්තා. එකම වතාවක් ඡන්දය දීමෙන් වැළකී සිටියා. අනෙක් සෑම වෙලාවකදීම අයවැයට ඡන්දය දුන්නා. අදත් බන්දුල මන්ත්‍රීතුමාට අත්‍යවශ්‍ය කාරණයකට යන්න තියෙනවා කිව්වා. නමුත් එතුමා කිව්වා කොහොම හරි එන්න බලන්නම් කියලා. කොහොමහරි එතුමා ඇවිල්ලා තියෙනවා. අයවැය ඡන්දය විමසීමෙන් පසුව. නමුත් එතුමා සිටියෙ අපි මොකක්ද කරන්න කියන තීන්දුවේ, එතුමා හිටිය නම් එතුමත් අයවැයට පක්ෂව ඡන්දය දෙනවා. ඒ අපි තුන් දෙනාම මේ අයවැයටවත්, මේ වැඩපිළිවෙලටවත් කැමති නිසා නොවේ. අපි තීන්දුවක් ගත්තම, එදත් එකට ගත්තා. අදත් එකට ගන්නවා. ඒ වගේම මගේ මන්ත්‍රීධූරය තවම තියෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී ධූරයෙන් නිදහස් කරන්න කියලා පක්ෂයේ ලේකම්තුමියටත් ලියුමෙ පිටපතක් යවලා තිබුණා. නමුත් මම දයාසිරි මන්ත්‍රීවරයටත් කතා කළා, මෙහෙම සංවිධායකතුමා ඉල්ලලා තියෙනවා, මොකක්ද අදහස කියලා. එතුමා මට කිව්වේ මගේ මන්ත්‍රී ධූරය සම්බන්ධයෙන් මට තවම ඒ සම්බන්ධව ගැටළුවක් නැහැ කියලා, කිසිදු වචනයකවත් දෙයක් එවලා නැහැ. ඒ නිසා මම තාම ඉන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය තුළ කැමති නම් ඡන්දය දෙන්න පුළුවන්, කැමතිනම් නොදී ඉන්න පුළුවන්. ඒක විවිධ සභාවල විවිධ ආකාරයෙන් වන්න පුළුවන්. කෙටියෙන්ම අපිට කියන්න පුළුවන් කැමතිනම් කැමති විදියක්. හැබැයි ඒකෙ පක්ෂය කියපු එක දෙයක් අපි ඇහුවේ නෑ. අපිට කිව්වේ උදව් කරනවා නම් උදව් කරන්න කියලා. නමුත් සත පහක උදව්වක් නොකළත් අපි උදව් කරනවා. නමුත් එක්සත් ජාතික පක්ෂය ඡන්දය දෙන්නේ නෑ කියලා, ඇයි කියන්නෙ කියලා මට ප්‍රශ්නයක් තියෙනවා. නමුත් මම අහන්න යන්නේ නැහැ. එතුමලගෙ ස්වාධීන අයිතිය ඒක. කොහේ ගියත් පොහොට්ටුවේ ආණ්ඩුවත් එක්ක එක මතයක දැන් ගමන් කරනවා. ඉතිං එහෙම වෙලාවක මෙතන එකමුතුවක් තියෙයිද කියලා ප්‍රශ්නයක් තියෙනවා. එතන එතුමන්ලට හිතෙන ආකාරයට, හැඟෙන ආකාරයට මිස, කිසි ප්‍රශ්නයක්, වැරැද්දක් අපි දකින්නේ නෑ. මොකද සභාවෙ තිබෙන සැලකිලිත් එක්ක, තමන්ට ඡන්දය දුන්න ජනතාවගේ එකෙදිනෙ තීන්දු කරන්න ඕන. සහබන්දු මහත්තයලා ඉන්න තැන ම තමයි අපිත් ඉන්න ඕන. ඒක නිසා ඒක ගැන මම තර්ක කරන්නේ නැහැ. ඒ විදියටම සමහර සභාවල පක්ෂයටම ඡන්දෙ දෙනවත් ඇති. ඒක අපි ගැටලුවක් කර ගන්න නරකයි මේ වෙලාවේ දී.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අයවැය, මේ සභාවේ සියලුම සභාපතිවරු ඉදිරිපත් කළ අයවැයත්, මේ අයවැයටම සමානයි. නිලධාරී ටික, අර තියෙන ගණන් ටිකත් තියෙනවා, කොටු තියෙනවා, ඒවා එහාට මෙහාට කරලා බැලන්ස් කරලා තමයි හැමදාම කරන්නේ. ඒකෙ ස්ථිරවම තියෙනවා වර්ග සැතපුම් ප්‍රමාණය, ගම්සභා යුගය, දිස්ත්‍රික් සංවර්ධන සභා යුගය, ඒ ටික ඒ විදියට තියෙනවා. ඒ විදියට ගමන් කරනවා.

ඊලග කාරනය, අපේ අය වැයට ඡන්දය දෙන්නේ, අයවැයට ඡන්දය නොදී මේ වෙලාවේ ඔබතුමාව අපහසුතාවයට පත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සභාව හැටියට මේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය අයවැයක් සම්මත නොකර ඒක විසිරෙව්වොත්, මේක පවත්වාගෙන යන්න බරපතළ අපහසුතා තියෙනවා. ඒවත් සැලකිල්ලට ගත්තම, මේක ආයතනයක් හැටියට පවත්වාගෙන යන්න ඕන කියන කාරණාව, සභාවේ තිබෙන අඩුපාඩු සම්බන්ධයෙන් සහබන්දු මහත්තයගෙ කතාවෙන් ප්‍රකාශ වුණා. ඒ වගේම තවදුරටත් කතා කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ වගේම ඒ මන්ත්‍රීතුමාගේ අදහසට එකඟ වෙනවා හැර, ඒ අදහසට එකඟ නෑ කියන්න බැහැ. ගරු සභාපතිතුමනි, හැබැයි අපි සභාපතිවරු ගානක් යටතේ සහ ලේකම්වරුන් ඉන්න කාලවලදී අපි වැඩ කළා. ඒ වැඩ කරන සෑම කාලසීමාවක දී ම අපි මීට වඩා දෙයක් දැක්කා. ඒක අපි අවධාරණය කරලා කියන්න ඕන. මේකෙ මීට වඩා ඍජු භාවයක් තිබුනා. මන් දන්නෑ දැන් නැත්තෙ ඇයි කියල. වෙනදා ගරු සභාපතිතුමනි, අපි සභාව තියන්න

කලින් දවසේ ඊට සතියකට කලින් සියළුම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කැඳවනවා. අපි අනිවාර්යෙන්ම ඒකට කැඳවනවා. ආරියතිලක මහත්මයා හිටියහමත් එහෙමයි. නිශාන්ත මහත්මයා, මේ සුසන්ත මහත්මයාගෙන් අහන්න සාක්ෂි, අපි දෙන්නා ඊට පසු වෙනිදත් කතා කරනවා. නිශාන්ත මහත්මයලගෙ ගෙදර, ඒ වන විට වැඩක් තියෙනවා, නොතිබෙනවා හෝ වේවා සාකච්ඡා විවිධ ආකාරයෙන් කෙරුණා. එදා තිබෙන දේ තමයි සාකච්ඡාව කුමන ආකාරයෙන් කෙරුණත්, කියනකොටම මේ සභාවේ මන්ත්‍රී කෙනෙක් නැගිටිනවා, යෝජනා කරනවා. එක විනාඩියක කාලයක් යන්නෙ නැහැ, තව මන්ත්‍රී කෙනෙක් ස්ථිර කරනවා. ඊයේ රෑ තීන්දු කරපු මන්ත්‍රීතුමා තමයි යෝජනාව ගේන්නේ. විරුද්ධ වුනත් හැමදාම ඡන්ද 8යි 5 යි. වෙනසක් වුණේම නැහැ කවදාවත්ම. දහතුන් දෙනා ඉන්න කාලේ 8යි 5 යි. මෙතන වගේ සුන්දර නැහැ, ඒ කාලේ මරාගන්න සයිස් එකට මෙතන කට්ටිය හිටියේ. පක්ෂය ඇඟට අර ගනිමින්, පක්ෂය ආරක්ෂා කරගන්න උත්සාහ කරමින්, විපක්ෂය විපක්ෂය වෙනුවෙනුත්, ආණ්ඩු පක්ෂය ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කැපවෙන පැහැදිලි වෙනසක්, බෙදීමක් ඒ කාලේ දක්නට ලැබුනා. නමුත් ඒක කෙරෙන්න ඕන ආයතන මට්ටමින්, සභාපති ගේ අභිමතය, සභාපති අනිවාර්යෙන් ක්‍රියාත්මක කෙරුවා. ඒකට කවුරුවත් බාධා කරන්න යන්නෙ නැහැ. ඒ විදිහට ඒ අනුව කටයුතු කළා. සභාපතිතුමා ලෙස තමන්ට අභිමතය අනුව කටයුතු කළා නම්, ඒක සිම්පල් කේස් එකක්. කවුරුත් දන්නෙ නැහැ යෝජනාව ස්ථිර වෙනවා. බෙදන්නෙ කොහොමද කියලා දන්නවා, කට හොල්ලන්න එපා සභාවේදි කියනවා, පරණ යෝජනා සම්මත වෙලා තියෙනවා. සල්ලි ටිකක් ඉතුරු වෙලා තියෙනවා. ප්‍රාදේශීය සභා විසුරුවා හරිද දන්නෙ නැහැ, ඉක්මනට සල්ලි ටික වියදම් කරමු පොඩ්ඩක් ණය වෙමු, ඉස්සරහට ඒගොල්ලන්ට ගෙවන්න හරින්න එහෙමවත් කතා කර ගන්නෙ නැති නිසා නේ මේ ප්‍රශ්න තියෙන්නේ. කණ්ඩායම් රැස්වීම් වලට ඔබතුමා එන්නේ නැහැ. එහෙම වුනානම් ඔබතුමාට වැඩ කරන්න පහසුයි. මේ මන්ත්‍රීවරු සතුටුයි සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ මේ හැමෝම මේ කොට්ඨාසෙ නියෝජිතයෝ. ඔබතුමාගෙන් මම දැක්ක දේ තමයි ඉන්න මන්ත්‍රීවරයෙක් ඔබතුමාගෙන් දුරකථනයෙන් අමතලා උදව්වක් ඉල්ලුවම ඔබතුමා කියනවා ඔය කොට්ඨාස මන්ත්‍රීවරයා එක්ක කතා කරගන්න කියල. නන්දන මන්ත්‍රිතුමා පෞද්ගලිකව නොවෙයි පොදු උදව්වක් ඉල්ලල ඔබතුමාට කතාකලහම, විජිත් මන්ත්‍රිතුමාගන් අහන්න කිව්වම, එතුමා මිත්‍රයෙක් වශයෙන් අහන්න පුළුවන්, නමුත් ඒකද සභාපතිතුමාගේ අභිමතය.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ මන්ත්‍රීවරුන්ගේ හිත දිනාගත්තෙ නෑ, ආදරය දිනා ගත්තෙ නෑ. අපි නම් එහෙම නොවෙයි. ලක්රුවන් මන්ත්‍රීතුමා දන්නවා, අපි බැරි අවස්ථාවල කොහොමද එකිනෙකාට උදව් කර ගත්තෙ. කොහොම කළේ, මොකක්ද කරන්න බැරි දේවල්, මේකෙ කොච්චර කරලා තියෙනවද? විලේගේ මහත්තයා ඉන්න කාලේ මිනිස්සුන්ට ගෙවලුත් හදලා දුන්නා. කරන්ට් එකත් අරන් දුන්නා. අද කොහොමද අහවි ලයිට් අරන් දෙන්නෙ, ගෙට උලුවස්ස තියන්න, වහල ගහන්නෙ කොහොමද අහවි. හරි පාරකට ඇස්තමේන්තුවක් දැම්ම පාර කපන්න කියලා, ඇස්තමේන්තුවට අනුව නෙමෙයි පාර කපලා තියෙන්නේ. ඌරල කන්දේ ලාල් මහත්තයලගේ ගෙවල් පාරට ලයිට් දුන්නා. දුන්නේ කොහොමද? සභාවෙන් ඇයි කරන්න බැරි? මන්ත්‍රීවරුන්ගේ එකගතාවය තියෙනවා නම්, ඒක කරන්න පුළුවන් විදිය හදනවානම්. ඒක තියෙන ඕන හැටියට කරන්න පුළුවන්, නමුත් මේ සභාවෙ ලේකම් මිස් කියාවි අනේ සභාපතිතුමා ඔය චෙක් එක නම් මට අත්සන් කරන්න බැහැ. ඔන්න ඒකක් හරි අඩු වුනොත් ඒ ගෙන්වන නිලධාරියාගෙන් අය කරන්න වෙනවා. රස්සාව දාලා ගෙදර යන්න වෙයි කියලා, ඇත්තටම නිලධාරියා අසරණයි. ඔබතුමා මූලාසනයේ මේවා අහන් ඉන්නවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මන්ත්‍රීතුමා ඔය දේවල් සියල්ල ඇත්ත. නමුත් අපි ඕවා එහෙම කරන්න යනකොට ඕව අසාධාරණ වැඩ, මම ඕව අනුමත නොකරන පහත් වැඩ. අද එහෙම කලොත් කීයක් විරුද්ධව වැඩ කරනවද? අද තාක්ෂණය දියුණුයි. ඒ කාලේ වගේ නෙමෙයි, හැමදේම වීඩියෝ කරලා ෆොටෝ ගහලා අන්තර්ජාලයට යවනවා

**ගරු මන්ත්‍රී අජිත් එඬේර ආරච්චි මහතා**

සමාවෙන්න සභාපතිතුමා, ඔබතුමා ඔය එක දෙයක්වත් කරන්න එපා. පොටෝ ගහන එක මේ කාලේ මේ තාක්ෂණය, එදාට ගැලපෙන තාක්ෂණයකුත් එදා තිබුණා, මේ වැඩ කරනකොට ඔබතුමා හොඳක් කලා නම්, හොඳක් කලා කියලා ඔය ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා කියාවි. මේ එහෙම නම් නීති රීති වලට එකඟ ව කරන වැඩ ටික කරල තියෙන්න එපයි. එහෙම නම් මේ මන්ත්‍රීවරු සංතෝෂ වෙන්න එපැයි, ඔබතුමාට ඡන්දෙත් දීලා අන්තිමේදී හිත නරක් කරගන්න මට අවශ්‍යතාවයක් නැහැ. හැබැයි හෙට දවසෙත් මෙතනින් පත් වෙන මන්ත්‍රීවරු ඔබ හරි, වෙන කෙනක් හරි, ඒ පත් වෙන අයට එහෙම වැඩ කරන්න පුළුවන් හැකියාවක් එහෙම ක්‍රමවේදයක් මෙතන හදල තැබිය යුතුවෙනවා. වැරදි හෝ හරි විදියට ෆයිල් එක තියනවනම්,

එදත් ඔය තාක්ෂණය තිබුණා. ඕන නම් ඉතින් ගේ ෆොටෝ ගහයි, කොට්ඨාසෙ ගෙවල් හදන්න කියලවත්, කොට්ඨාසයට ලයිට් දෙන්න කියලාවත් නෙවෙයි මම කියන්නේ. ඔබතුමාගේ වැරදි දිගින් දිගට කියනවා නෙමෙයි. මම කියන්නේ, ඉතිහාස සභාපතිවරුන් කරා, ආණ්ඩු පක්ෂයේ සභාපතිවරුන් නිහඬව ඉන්නේ, ඔබතුමා හොඳක් කලා නම් ඒ හොඳ කියාවිනෙ. එහෙම නම් නීති රීති වලට එකඟව, කරන්න තියෙන වැඩ ටික කරලා තියෙන්න එපැයි. එහෙමත් නැහැනේ. ඒ නිසා මම මේ සම්බන්ධව මීට වැඩිය කතා කරන්න යන්නේ නැහැ. ඔබතුමාට ඡන්දෙත් දීලා හිත නරක් කර ගන්න මට වුවමනාවක් නැහැ. මම කිව්වේ හෙට දවසෙත් මෙතනින් මන්ත්‍රීවරු පත්වේවි. ඔබ හෝ වෙනත් කෙනෙක් හෝ වේවා, ඔවුන්ට මේ සභාවේ වැඩ කරන්න පුළුවන් හැකියාවක්, එහෙම ක්‍රම තියෙනවා. එහෙම ක්‍රම වැරදි නැහැ. වැරදි දේ හරි, හරි විදියට ෆයිල් එක තියෙනවා නම් මොකද්ද කියන ප්‍රශ්නය? කවදාවත් පෙත්සම් ගිහිල්ලා නැත්නම්, බලන් හිටිය කෙනා විරුද්ධ නැත්නම්, කරපු කෙනා විරුද්ධ නැත්නම්, අත්සන් කරපු තාක්ෂණ නිලධාරී විරුද්ධ නැත්නම්, චෙක් එකට අත්සන් කරපු ලේකම්ගේ ප්‍රශ්නයක් නැත්නම්, මොකද්ද තියෙන ප්‍රශ්නය? ඒ නිසා අපි සියලු දෙනාම කැපවෙන්නේ මහජනතාවට සේවය කිරීම සඳහා, මොකද මේ සියලු දෙනාටම තිබෙන අභිලාෂය මේක, මේ හැම කෙනාටම දුක තියෙන්නෙ, ලබන පාර ඡන්දයටවත් දාගන්න විදිහක් නැහැ. කරපු දෙයක් නැති නිසා, ගම්වල ගිහිල්ලා මිනිස්සුන්ට කියන්න දෙයක් නැහැ. සහබන්දු මහත්තයා කිව්ව වගේ පතිනායක මන්ත්‍රීතුමාගේ ලිඳ වගේ, අවුරුදු 5 ක් කරගන්න බැරි වුණා කියලා මම කියන්න යන්නේ නැහැ. එතුමගේ හදවතේ තියෙනවා මම මේකවත් අවුරුදු 5 ක් කරගන්න බැරිවුන නිසා, ඡන්දයකට යන්නෙ කොහොමද කියලා. ඒ නිසා කරන්න පුළුවන් වැඩ සහ කරන්න බැරි වැඩ තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා, ඔබතුමා හොඳ මහත්තයෙක්. මෙහෙම බැන බැන හොඳ සභාපතිවරයෙක් කියන්න බැහැනේ. මේක විසුරුවන්නත් එපා. ඔබතුමා තව අවුරුදු එකක් කළත් අපේ කිසි විරෝධයක් නැහැ. අපි විශ්වාස කරනවා සභාපතිතුමනි, ඊයේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කොට්ඨාස තීරණය කරලා තියෙනවා. කොට්ඨාස අටකට මේක අඩු කරල තියෙනවා. කොට්ඨාස අටයි තියෙන්නෙ. කොට්ඨාස 15 අඩු කරලා. උඩුගම කොට්ඨාස 5, 3 කරලා, උඩුගම මධ්‍යම, උක්ඕවිට/ගෝණදෙනිය, උඩලමත්ත බණ්ඩාරනායකපුර, හඟරන්වල එක කොට්ඨාශයක් කරලා, ගමගොඩ උතුර, කැටගොඩ, හෝමදොල නැගෙනහිර ඡන්ද පෙට්ටිය මහා විද්‍යාලයේ ඡන්ද පෙට්ටිය එක් කරලා කොටස් තුනකට වෙන් කරල තියෙනවා. තුන්දෙනා, තුන්දෙනා එකකට දාලා මනාපයක් හදලා, ඒ නිසා ඉස්සරහට ඒ ක්‍රමවේදයන්ට සීමා නිර්ණය විතරයි. අද පනත ගේනවා කිව්වා. අද පනත ගේන බවකුත් නැහැ. සමහර විට ඡන්දය නොතියනවා කිව්වට තියෙන්නත් පුළුවන්. මේකෙ තියෙන ක්‍රමයට තියෙනවා නම් තියන්නේ. එහෙම නැති වුණොත් විතරයි ඔය හදන කොට්ඨාස වලට තියෙන්නේ. පනත න්‍යාය පත්‍රයට ඇතුල් කරපු නැති නිසා ඒක අපි දන්නෙ නැහැ. කොමිසමේ වැඩ ටික යන නිසා ඔවුන් හිතනවා ඡන්දය තියයි කියලා. පාර්ලිමේන්තු පනතක් ගෙනැල්ලා කෙසේ නමුත් සියලු පක්ෂ සූදානම් වුණා. දැන් තිබුනොත් තියන්නේ මේ ක්‍රමයට. නැවත 27 එනවා මෙතනට. 13 ක් ඉන්නවා වගේ නෙවෙයි 27 ක් ඉන්නකොට එකටත් එකක් වැඩියි. ඇත්තටම වැඩ කරන්නත් අමාරුයි. j.c.b. පැය එකක් දෙනවා නම් පැය විසි හතක්

දෙන්න ඕන. එහෙම ප්‍රශ්නෙකුත් තිබුණා. මෙතුමාට වැඩ කිරීමේදී තව ප්‍රශ්නයක් තමයි ඒක. අනෙක් පැත්තෙන් ගරු සභාපතිතුමනි, කොමසාරිස්ට ඔබතුමා හිතයි අරයට මෙයාට දොස් කිව්වා, එයාට මෙයා සංසන්දනය කලා, මම කරපු දෙයක් නෙමෙයි මෙයාල මට කැගැහුවට ඡන්දය නොදී හිටිය නම් ප්‍රශ්නයක් නැහැ කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා සම්බන්ධයෙනුත් කියන්න ඕන. ඔබතුමා සභාව ගන්නකොට, මේ සභාව ගත්තේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමත්, රනිල් මහත්තයා ඉන්න ආණ්ඩුවක ඔබතුමාට වැඩක් කරගන්න හැකියාවක් ලැබුනෙ නැහැ. ඊළඟට ගෝඨාභය මහත්තයා ආවා. ඊට පස්සේ ආවා කොරෝනා. ඔබතුමාට වැඩ කරන්න හම්බ වුනේ නැහැ. ඊට පස්සේ කැරැල්ල ඇති වුනා. ඊට පස්සේ ආර්ථික ප්‍රශ්න ජාලයකට ඇවිල්ලා කරන්න බැරි වුනා. ඒ එකම තත්ත්වයන්ට පත්වෙච්ච සභාපති ඔබතුමා අසාමාන්‍ය තත්ත්වයන්ට මුහුණ දෙන්න වුණු සභාපතිවරයෙක්. එනිසා ඔබතුමාට ඕන නම් මගෙන් ප්‍රවේශයක් අරගෙන අපි කියපු සියලුම දේවල් සිද්ධ වුණේ ඔය කරුණු නිසාය කියලා කියන්න පුළුවන්. අය වැය ගැන කතා කළොත්, මේ අවුරුද්දේ බැරිනම් ලබන අවුරුද්දෙවත් අක්කර බදු ලේඛනයෙන් කපන්න. මොකද අපි අක්කර බදු එකතු කරන්නේ නැහැ. ලේඛනය පවත්වාගෙන යනවා. අයවැය ලේඛනයට ඒකෙන් අපේක්ෂිත මුදලක් අරගෙන යනවා දිගටම, මේ අයවැයෙත් ඒක තියෙනවා. ඒ නිසා දේශීය ණය අරමුදලෙන් ණය ගැනීම සඳහා, ඒ ණය පියවන හැටි මේ අයවැයේ කියලා තියෙනවා. අපේක්ෂිත ආදායම් නොවෙයි දාලා තියෙන්නෙ. ඒව දාන්න වුණා. අපි දැනගන්න කොට මේකෙ ණය ගෙවන්න අපේක්ෂිත මුදල් නැහැ මේකෙ, ඒගොල්ලන්ට පෙන්නන්න ඕන වුණා, දේශිය ණය අරමුදලෙන් ණය ගන්න කොට වාරිකය පෙන්නන්නෙ කොහොමද කියලා. ඒකට දාපු කාරණා පැහැදිලිවම රුපියලක්වත් එන්නේ නැති කාරණා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒව ගැනත් තීරණයක් ගන්න. හැබැයි ඔබතුමා බලාපොරොත්තු වෙච්ච ආදාහනාගාරය කොහොමහරි සිද්ධ කරන්න. ඔබතුමාගේ පාලන කාලේ පටන් ගත්ත වැඩේ ඒක සිද්ධ කරලා, ඔබතුමාම විවෘත කරන්න කියල මම ඉල්ලනවා. මා මීට වඩා දීර්ඝව කතා කරන්නේ නැහැ. ලබන්නාවූ නත්තල සාමයෙන් සතුටින් පිරි සුබ නත්තලක් වෙන්න කියලත්, ලබන්නාවූ නව වසර ලෙඩෙන් දුකෙන් තොර නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරමින්, නිවැරදි ජනමතයක් උරගා බලන්න ලබන අවුරුද්දෙවත් හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. 2023 නාගොඩ ප්‍රාදේශීය සභා අයවැයට විරුද්ධව මම යෝජනාව ඉදිරිපත් කළා. අපේ ජයවීර මන්ත්‍රීතුමා ස්ථිර කළා. වැඩි ඡන්ද 7කින් අයවැය සම්මත වුණා.

ඇත්තටම ස්තුතිවන්ත වෙනවා මාත් සමග එක්සත් ජාතික පක්ෂ සාමාජික පිරිස, ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාත්, ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක මන්ත්‍රීතුමියත් විපක්ෂව ඡන්දය දුන්නා. මේ වෙලාවේ මම ස්තුතිවන්ත වෙනවා, සභාවක් හැටියට මේ වෙලාවේ එක් පැත්තකින් මම කනගාටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නෙලී වක්වැල්ල මන්ත්‍රීතුමියත්, බන්දුල හිරිමුතුගොඩ මන්ත්‍රීතුමත් වෙනත් මතයක් දැරුවට, අපේ අජිත් මන්ත්‍රීතුමාටත් අපි උදේ කිව්වා අයවැයට විරුද්ධව ඡන්දය දෙනවා, ඔබතුමා සහයෝගය දෙන්න කියලා. මේ වෙලාවේ අයවැයට පක්ෂව ඡන්දය දුන්නා. මම විශ්වාස කළා, සමගි ජන බලවේගය පක්ෂය සමග පසුගිය කාලේ එතුමා සම්බන්ධ වුණා. මම හිතුවා අයවැයට පක්ෂව ඡන්දය ලබා දෙනවා කියලා. නමුත් කණගාටු වෙනවා පක්ෂයක් හැටියට අපි ලංකාව පුරාම තියෙන වසර අවසාන අයවැයේදී, රජයට විරුද්ධව කටයුතු කරනවා. ඒක එතුමගේ මතය වෙන්න පුළුවන්. නමුත් ඒක එහෙමම තියෙද්දි මේ වෙලාවේ ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමනි, මුලින්ම මම සඳහන් කරන්න ඕන. පසුගිය 2022 අවුරුද්ද 2021 අවුරුද්ද මේ සභාවේ මෙතුමන්ලට රජයත්, ජනාධිපතිවරයෙක් හා බලය තියෙද්දි, මේ සභාවේ යම් වැඩපිළිවෙළක් කරන්න තිබුණා. මම විපක්ෂ නායකතුමාගෙ කතාවේ සඳහන් කරුණු ගැන කතා කරන්න යන්නැහැ. එතුමා දීර්ඝ විශ්ලේෂණයක් කළා කරුණු කාරණා සම්බන්ධව. හැබැයි මේ

වෙලාවේ සභාවේ මුල්ම බලාපොරොත්තුව තියෙන්නෙ මේ ආදාහනාගාරයේ කටයුතු ඉවර කරන්න. අපි මුලින් ආදාහනාගාරය කටයුත්ත ආරම්භ කළේ යහපාලන ආණ්ඩුව කාලේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා හා මෛත්‍රීපාල මහත්තයාගේ ආණ්ඩුව කාලේ ඉඩම් කෑල්ලක් වෙන් කරන්න, හිටපු ඉඩම් ඇමති ගයන්ත කරුණාතිලක මැතිතුමා ඉඩම වෙන් කරන කොටම අපේ ගාලු දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරන නායක වජිර අබේවර්ධන මැතිතුමා ලක්ෂ දෙදහක් මුදල ලබා දෙන්න වැඩ කටයුතු සකස් කරලා තිබුණා. හැබැයි එවෙලෙ සභාපතිවරයා හරියට ක්‍රියාශීලී වුනා නම්, මෙලහකට මේ ආදාහනාගාරයේ වැඩේ ඉවරයි. මොකද ඒ කාලේ ක්ෂණිකව මුදල් ලබලා දුන්නා සංවර්ධන වැඩවලට. ක්ෂණිකව වැඩ නිම කරන්නත් සැලැස්මක් යහපාලන ආන්ඩුවේ තිබුණා. පැවැතුනු රජයන් වලින් යම් යම් ආධාර දුන්නත්, මේ සභාව ගොඩගන්න බැරි වුණේ සභාපතිතුමාගේ තිබෙන අදක්ෂතාවයද, නැත්නම් කාර්යක්ෂමතාවය අඩු බවද මන්දා. එන්න එන්නම පස්සට ගියා. රටේ විවිධ ප්‍රශ්න, අර්බුධ ආවා. ඒත් කරන් යන්න තිබුණා. අර තල්ගස්වල වෙළඳ සංකීර්ණයත් හදලා දැන් වල් බිහිවෙලා තියෙන්නෙ. කොන්ක්‍රීට් අඩිතාලම විතරයි දැම්මේ. මේකටත් ලක්ෂ 100 ක් විතර ආවා. මේවා කරන්න පුළුවන් ක්‍රම තිබුණා. හැබැයි කරන්න බැරිවුණා. ඔබතුමා කිව්ව වගේ, නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියන්ලා ලැජ්ජ වෙන්න ඕන අය වැයට පක්ෂව ඡන්දය දුන්නට. ඔබතුමියන්ට මොනවද කළේ? අද මගේ ගමේ ගල්වාන මාර්ගයේ පයින්වත් යන්න බැහැ. පාරවල් කැඩිලා, ඒ තරමට අබලන් වෙලා, මිනිස්සුන්ට දැන් යන එන මං නැති වෙලා තියෙන්නෙ. මේ වගේ තමයි හැම අතුරු මාර්ගයක්ම. කාබිල් පාර අතුරු මාර්ග ඇඩි වර්ෂාවක් එක්ක සෝදා පාළු වෙලා, නමුත් අපි සභාවක් හැටියට ඒ වෙනුවෙන් සංවර්ධන වැඩ වලට මොනවද කරන්නේ?

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. 2023 නාගොඩ ප්‍රාදේශීය සභා අයවැය සභාවට ඉදිරිපත් කළා. වැඩි ඡන්ද 7 කින් අයවැය සභා සම්මත වුණා. ඒ නිසා අපේ ගෞරවය ප්‍රණාමය, අපේ මේ කටයුතු කරන්න මූලික වුණු නිලධාරීන් පළමුවෙන්ම මා සිහිපත් කරනවා. සාම්ප්‍රදායක විදියට ඉදිරිපත් කරලා අපට තිබෙන අයවැය ලේඛන දිහා බැලුවම, 2018 සිට පස් අවුරුද්දක අයවැය ලේඛන ඉදිරිපත් කළා. එයින් අපිට සාක්ෂාත් කරගන්න හැකියාව යම් තාක් දුරට නොලැබුණත්, කොහොම වුණත් මෙම අයවැය ඉදිරිපත් කලාට අපේ පරිපාලන කටයුතු වල දී තිබෙන දක්ෂතාවය හා උනන්දුව මත තමයි මේවායේ කාරණයන් සාක්ෂාත් කරගැනීමට හැකියාව තිබෙන්නේ. කොහොම වුණත් අපි විශ්වාස කරනවා මේ වෙලාවේ, පුළුවන් මට්ටමෙන් අයවැයක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ අයවැය අනෙක් සාම්ප්‍රදායික අයවැය වලට වැඩිය මේ අයවැය සාර්ථක කරගන්න, දේශපාලන අධිකාරියට හැකියාව ලැබේවායි මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපි අවුරුදු පහක් තුළ, මේ වගේම මන්ත්‍රීධූරයන් දරමින් අපේ ප්‍රදේශයන්ට විශාල වශයෙන් සේවය කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ කොහොම වුණත් මම දකිනවා පෞද්ගලිකව, 2018 පත්වෙච්ච මන්ත්‍රීවරයෙක් ලෙස ගමට යම් වැඩ කොටසක් කිරීමේ හැකියාව ලැබුණා. පෞද්ගලිකව අනෙක් මන්ත්‍රීවරුන් මොන මතයක හිටියත් මට 50% ක් මහජනතාව වෙනුවෙන් සේවය කරන්න ලැබුනා. මේ නවක මන්ත්‍රීවරුන් ලෙස පත් වෙලා ඇවිල්ලා, නව බලාපොරොත්තු රාශියක් අතැතිව, ජනතාවගේ බලාපොරොත්තු රාශියක් මැද්දේ, අපි මේ සභාව නියෝජනය කලත්, නමුත් ඒ සියල්ල කිරීමේදී යම් යම් අභාවයන්ට පත්වෙන්න සිද්ධ වුණා. ඉහළ දේශපාලන අධිකාරියේ තිබෙන කොන්ද පණ නැතිකම නිසා නාගොඩ ප්‍රාදේශීය සභාව ගත්තම, එහි දේශපාලන අධිකාරියත්, ඒ වගේම සභාවේ නිලධාරීනුත් යම් එක මතයක කටයුතු නොකිරීම තුළ යම් වැඩ කොටසක් කිරීමේ හැකියාව නොමැති වුණා. මම සඳහන් කරන්නෙ, මේ අපේ ප්‍රාදේශීය සභාවේ මම දන්නෑ අනෙක් ප්‍රාදේශීය සභාවල යම් ගැටලුවක් ඇති වුනා නම්, ගාල්ලෙන් එන විමර්ශන නිලධාරීයාගේ ගාවට ෆයිල් ගෙනිහිල්ලා, උපදෙස් අරගෙන, ඒ විමර්ශන නිලධාරි

එන්නේ මේ සභාවේ යම් අඩුපාඩුවක් වෙලා තියෙනවා නම්, යම් විදියකින් ඒ අයත් සමඟ තමයි සාකච්ඡා කළේ. මේ සභාවේ ගනු ලබන තීරණ යම් අවස්ථාවලදී අභියෝගයට ලක් කරලා තියෙනවා. සභාව යෝජනා කළත් එහෙම කරන්න බැහැ කියලා, මොකද යම් අවස්ථාවලදී ඒ වගේ කටයුතු සිදු වුණා. ඒ නිසා මේකෙදි යම් බයක් මේ නිලධාරීන් තුළ ගොඩනැඟුණා. ඒ ගොඩනැගිච්ච එක තුළ යම් ලොකු අවාසියක් වුණා. මේක සභාවේ අයට පමණක් නොවෙයි, අපේ මුළු ලංකාවම ගත්තම දේශපාලන අධිකාරියට තමයි ඇඟිල්ල දික් වෙලා තියෙන්නෙ. මේ රටට කිසි වැඩපිළිවෙළක් ඉදිරිපත් කළේ නැහැ කියලා. නමුත් නිදහස් අධ්‍යාපනයෙන් පස්සෙ බිහිවුණු ලංකාවේ සියලු නිලධාරීන් ඉංජිනේරුවෝ වෙන්න හැමෝටම බැහැ. නමුත් විදුලිබල මණ්ඩලයේ ඉන්න ඉංජිනේරුවන්ගේ යෝජනාව තියෙන්නේ, වෙලාව තීරණය කරන්න විතරයි. ලංකාව කියන මේ සුන්දර රටට ඉන්ධන භාවිතා නොකර විදුලිය සපයා දීමේ හැකියාව ඕන තරම් අවස්ථාව තියෙනවා. මේ රටට වෙන දේවල් මේ නිලධාරී කණ්ඩායම සහ මේ දේශපාලන අධිකාරිය එක මතයකට ගේන්නේ නැතිව, අඳුරේ අතපත ගෑවට, මේ කටයුතු සිද්ධ කරන්න බැහැ. මේ වෙලාවේ වනමල් මන්ත්‍රීතුමා කියාසිටියා, 2015 වර්ෂය තමයි ඒගොල්ලෝ ස්වර්ණමය කාල වකවානුව කියලා, ඕනම කටයුත්තක් නිම කරන්න ඒ කටයුතු සූදානම් කළේ කියලා. හැබැයි මතක තියාගන්න, මහ බැංකු වාර්තා අනුව කියන්නෙ, ලංකා ඉතිහාසයේ වැඩිම ණය ප්‍රමාණයක් අරන් තියෙන්නේ 2015 වර්ෂයේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රජය තමයි. ඒ වෙලාවෙත් රටේ පැහැදිලි තීරණාත්මක සංවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වුණාද? ඒ වගේම ණය වලින් ජනතාවට සාධාරණයක් ඉෂ්ඨ කරලා තියෙනවද? එකිනෙක ලොකු ප්‍රශ්නයක් තියෙන්නේ. ඒ නිසා මතක තියාගන්න, මේ රටේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගෙන් පස්සේ, (1977 න් පස්සේ) ආපු ඔය සියලු දෙනාම අඩු වැඩි වශයෙන් මේ රටේ තිබෙන තත්වයට වග කියන්න ඕන. අපිත් ඔය පාපකර්මයට කර ගහපු අය. ඉදිරියේදී කිසිදු පක්ෂයකට නැතිව ස්වාධීනව කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ තරම් අපි කලකිරිලා ඉන්නේ. මේ සියලු දෙනා පිළිබඳව, එක පක්ෂයක් නොවේ, දැනට තිබෙන සියලුම පක්ෂ වල සියලුම දෙනාම මේකට වගකිව යුතු වෙනවා. මේ රට පාලනය කළා ද නැද්ද කියන එක නෙමෙයි මෙතනදී තියෙන්නෙ, මේ රට නැවත හොඳ තත්වයට ගන්නනම්, පක්ෂ පාට බලන් නැතිව, මේ ආණ්ඩුව පෙල්ලලා, අර ආණ්ඩුව හදන්නවත්, අර ආණ්ඩුව පෙල්ලලා, මේ ආණ්ඩුව හදන්නවත් නෙවෙයි. මේක ආකල්පමය වෙනසක් ඇති කරන්න ඕන අවස්ථාවක්. පොරොන්දු දේශපාලනය නැති කරන්න ඕන. හැම වෙලාවෙම මේක තීරණය වෙන්නේ පොරොන්දු දේශපාලනය මත, අපේ රට කෘෂි කර්මාන්ත රටක් වුණත්, එම කෘෂිකර්මාන්තය නංවාලන් නැතිව, එය යම් යම් දේ එකතු කිරීම මත, එය අවාසනාවකට විනාශ වෙලා තියෙනවා. රටේ සංවර්ධනය කියන්නේ භෞතික දේවල් සංවර්ධනය කිරීම විතරක්ම නොවෙයි. ආකල්පමය අතිනුත් සංවර්ධනය කළ යුතුයි. එසේ නොමැති වුවහොත් මේ රට කවදාවත් සංවර්ධනය කරන්න වෙන්නේ නැහැ. මැයි 9 යම් සිදුවීම් මාලාවක් සිද්ධ වුණා. එදින මටත්, සුභාෂි මන්ත්‍රීතුමියටත් ලොකු අලාභ හානියක් සිද්ධ වුණා. ඒක වචනවලින් කියලා නිම කරන්න බැහැ. ඒ වගේම එම සිද්ධිය සල්ලි තියෙන අයට ප්‍රශ්නයක් නොවුණත්, අපිට විශාල හානියක් සිද්ධ වුණා. නමුත් අපි හැමෝටම ඕනම දේශපාලන මතයක් දරන්න පුළුවන් වගේම, අපේ නිවෙස් වලට හානියක් කරන්න කිසිම කෙනෙකුට අයිතියක් නැහැ. නමුත් නිවෙස් දෙකම විනාශ කරලා දැම්මා. විනාශයට පස්සෙ කණ්ඩායම් දෙකක් ආවා. පළමුවෙන්ම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ආවා. දෙවනුව, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආවා. මේ කණ්ඩායම් දෙකම ගිහිල්ලා, තව ප්‍රහාරයක් දියත් කළා, මේකෙ තක්සේරුවට අනුව, ගෙදර දොරේ ලොක් එකවත් දාගන්න බැරි විදියට තක්සේරු කළේ. අපේ ගෙදර වාඩිවෙන්න පුටුවක් ඉතිරි කළේ නැහැ. මගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරන්නවත් පොත් පත්, ඇඳුම් පැළඳුම් එකක්වත් ඉතුරු කළේ නැහැ. මම මේ වෙලාවේ ගරු කරනවා, ධර්මසිරි මන්ත්‍රීතුමාට. එතුමා තමයි මගේ දරුවෝ පාසල් යවන්න සියලුම දේවල් අරන් දුන්නෙ. ඒ වගේම

නම් සඳහන් නොකළත්, යම් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මට යම් අයුරින් උපකාර කළා. අපිට සිදුව ඇති දේ ගැන අද වෙනකම්ම සොයා බලන්න කෙනෙක් සිටියේ නැහැ. ඇත්තටම මම මේ දේ සඳහන් කරන්නේ බොහොම කණගාටුවෙන්. මේ ප්‍රහාරය දියත් වුනේ අපේ පෞද්ගලික භේද මත නෙමෙයි, මේ රටේ කවුරු පාලකයා වුවත්, කවුරු අගමැති වුනත්, කවුරු විපක්ෂ නායක වුණත්, අපිත් අසරණයි. අපට යමක් කිරීමේ හැකියාව එතුමන්ලාට තියෙනවා. නමුත් අපි වෙනුවෙන් කතා කරන්න කිසිම දේශපාලන නායකයෙක්වත් මන්ත්‍රීවරයෙක්වත් හිටියෙ නැහැ. මේ දේ අද දවසේ මට, සුභාෂිට, හෙට දවසේ ඔබට වෙන්න පුළුවන්. අපි ඉතාම අසරණ වෙලා ඉන්නේ. රටේ තිබෙන තත්ත්වයන් සමගම අඩු වැඩි නැතිව මේ දේවල් මේ තත්ත්වයට පත් වුණේ අපේ පක්ෂ දේශපාලඥයන්ගේ කටවල් නිසා. කොටසක් සාධාරණීකරණය කළා. දේශපාලනඥයන්ම ඔවුන්ටම ගහලා, දේශපාලනඥයෝ නැත්තටම නැති කරල තියෙන්නෙ. ඉදිරියේදී දේශපාලනයට එනවා නම්, නැවත සංගායනාවක් කරල දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න. පොලිසිය අපේ ගෙවල් පරික්ෂා කරලා, සිදුවූ අලාභය ලක්ෂ 15ක එහා පැත්ත තක්සේරු කරලා, උසාවියට ඉදිරිපත් කළා. ඒ සියල්ල යට යනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා තක්සේරු කාර්යාලය කරපු තක්සේරුවත් එක්ක කරන්න බැරිනම්, නොකර හිටිය නම් හරි. ඒ කණ්ඩායමෙන් හිටියෙ, මේ ප්‍රහාරය දියත් කරපු කණ්ඩායම නාගොඩ ප්‍රාදේශිය සභාව සම්බන්ධ කිසි කෙනෙක් නෙමෙයි. අරගලය ක්‍රියාත්මක කරන්න ගියේ බද්දේගම බාර්එක කඩාගෙන ආපු මේ බීමත් පිරිසක් තමයි, ඒ දේ සාධාරණීකරණය කළා. මේ තක්සේරුවත් එක්ක මේ සිද්ධි සම්බන්ධව දැඩිව පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. මේ ඉන්න 27 දෙනාට ඉදිරියේදී මේ දේශපාලන ගමන්මග නිවැරැදි මාර්ගයක හැසිරවීම සඳහා ලොකු කැපවීමක් කළ යුතුව තිබෙනවා. රට ගොඩනගන්න පුළුවන් හොඳ දේශපාලනඥයෝ කණ්ඩායමක් පාර්ලිමේන්තුවට යැවීමට ඔබ හැමදෙනාටම ලොකු වගකීමක් තියෙනවා. මේ සභා කාලේ අවසානයේදී හරි, මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා, මන්ත්‍රීවරු වෙනුවෙන් යම් මුදලක් වෙන්කරලා, දීර්ඝකාලීනව ඒ අය වෙනුවෙන් යමක් කරලා, මේ කාලවකවානුව තුළ මොන මතවාද තිබුණත්, අපි කණ්ඩායමක් ලෙස එකට හිටියා. ඒ පිළිබඳවත් විශේෂයෙන් සලකන්නට ඕන. ඒ බවත් සඳහන් කරමින්, අවසාන වශයෙන් මට කියන්න තියෙන්නේ, ප්‍රාදේශීය සභාව තුළ අපට යමක් කරන්න බැරි වුනත්, අපිට ගමේ මිනිස්සුන්ට යමක් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා දැන් අලුත් මැතිවරණ ක්‍රමයකට ගිහිල්ලා, ක්‍රමවත් වැඩ පිළිවෙලක් කරලා, නාගොඩ ප්‍රාදේශීය සභාව, සුවිශේෂී ස්ථානයකට ගෙනියන්න ඕන. ආදාහනාගාරයත් සභාපතිතුමාගේ හීනයක්. ඒක ඉදිරි කාලයේදී ඉටු කර ගැනීමට හැකියාව ලැබෙන්න කියලත්, නිලධාරීන් දේශපාලන අධිකාරියත් එකට එකතු වෙලා, වැඩ කටයුතු කළානම්, මීට වඩා දුරක් යන්න තිබුණයි කියන එකත් සඳහන් කරමින්, මේ සභාවේ තිබෙන ආදායම් තත්වය තුළ, සභාවෙන් යමක් කරන්න බැරි වුනත්, අපි ගම් තුළ ජන ආකර්ෂණය සඳහා හැම කෙනෙක්ම වැඩ ටිකක් කළා. උදාහරණ විදියට මම උඩවැලිවිටිය කොට්ඨාසය තුළ, යම් දෙයක්, මම පක්ෂ පාට නොබලා හැමදෙනාටම ඒ දේවල් බෙදලා දුන්නා. නමුත් ගමේ කට්ටිය කලේ මට පාට පක්ෂ බැලීම පමණයි. ඒකත් මේ වෙලාවේ සඳහන් කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීමණ්ඩලයෙන් අවසරයි.වනමල් මන්ත්‍රිතුමා අයවැය සම්බන්ධව කතා කරලා, එතුමා කිව්වා, වංචා දූෂණ සිද්ධ වෙනවා කියලා. අපි ඒක හෙළා දකිනවා. අපි බොහොම අවංකව කිව්වොත්, එහෙම දේවල් සිද්ධ වෙන්නේ නැහැ. එහෙම වෙලත් නැතුව ඇති. යම් යම් අඩුපාඩු වෙන්න ඇති. ගරු සභාපතිතුමා, එහෙම වුණාට අපිත් ඒ ගැන කණගාටු වෙනවා. රංජිත් මන්ත්‍රිතුමා කතා කලා, අද කාලෙ රාත්‍රී මළ ගෙදරකටවත් මන්ත්‍රීවරයෙකුට යන්න බැහැයි කියලා කිව්වා. මම හිතන්නේ මේ සභාවෙන් පක්ෂ විපක්ෂ කිසිම කෙනෙකුට එහෙම ප්‍රශ්නයක් තාම නැහැ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු බොහොම වැදගත්

විදිහට හැසිරෙනවා මං දැකලා තියෙනවා. රෑ දවල් බය නැතිව, කටයුතු කරන පිරිසක් මම හිතන්නේ අපේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමාට වැරදීමක්. සමහරු ඡන්දය භීෂණය මවාගෙන ඉන්න තත්ත්වයක් මවාගෙන බොරුවට ඡන්දය ඉල්ලනවා. මම කියන්නේ අපේ පොදුජන පෙරමුණේ අපි ඉල්ලා සිටින්නේ, ඡන්දයක් තියන්න කියලා. මොකද ඔය කෑ ගහන කට්ටිය තිබෙන ජනතා බලය බලා ගන්න පුළුවන් එවිට. ඔබතුමා එවැනි කතා කියනකොට බොහොම කල්පනාකාරීව වචන හසුරුවන්න කියල ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, ආදාහනාගාරය පිළිබඳ අද කතා කළා. මගේ පුද්ගලික අදහස ණය වෙලා හරි මේක කරන්න. ණය ගෙවන්න යම් ක්‍රමයක් යෙදේවී. ණය වෙලා හරි කිරීමට හැකියාව ඔබතුමාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම සුභ අනාගතයක්, සුභ සන්ධ්‍යාවක් සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගන්වත්ත මහතා**

සුභ දවසක් ගරු සභාපතිතුමනි, මම මීට පෙරාතුව සිට වසර ගණනක් ඉඳලා ඉල්ලපු පාර. ඒතුමා අද කිව්වා ඒක කරගන්න පුළුවන් කියලා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේක අවසන් සභාවාරය වෙයිද දන්නෑ. ලක්ෂ දෙකක් වෙන් කරපු එකෙන් එකක් සිහිපත් කරනවා ඒ වගේම දැන් අද ඉල්ලීමක් කරනවා ප්‍රජා ශාලාවට, අපට වෙන මොනවත්, පොත්පත් ඕනේ නැහැ. ඒක හදලා දෙන්න. එම ප්‍රජාශාලාව සභාවෙ සම්පතක්. ඒක විනාශ වෙන්න නොදී හදලා දෙන්න කියලා ඉල්ලනවා. ඒ වගේම අපේ පාරේ යන්නම බෑ කියලා වනමල් මන්ත්‍රීතුමා සඳහන් කරලා තිබුණා. එතුමා කිව්වා වගේ, ඇත්තටම යන්න බෑ. අපි ඉල්ලපු ක්‍රමවේදයට පාර දුන්න නම් එහෙම වෙන්නෙ නැහැ. මම කමිටුවේ සභාපති ලෙස සම්පත් අතුකෝරල මහත්මයා මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා. ඒ නිසා තමයි කාපට් එක තියෙන පැත්තෙම ගිහිල්ලා පාර හැදුවෙ. මේ වලවල් ටික පිළිසකර කර ගන්න. ගොවි සංවිධානය සමග සාකච්ඡා කර ගත්තා. ලක්ෂ 23 ක් චම්ලි විතානාච්චි මහත්මයා දුන්නා. ඒ බවත් සතුටින් මතක් කරමින්, ඔබ සියලු දෙනාටම ලබන්නා වූ නව වසර, සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

සියලු දෙනාගෙන් අවසරයි. අද ඇත්තටම අපි කවුරුත් හිතන ආකාරයට අවසන් සභාවාරයද කියලා කියන්න බැහැ. සමහරුන්ගේ මතය තව මාස තුනක් මේ සභාව තියෙනවා යන්නයි. සියලු දෙනාටම මේ අවස්ථාවේදී කතා කරන්න ලබාදීමට නොහැකිවීම පිළිබඳ කනගාටු වෙනවා. පළමුවෙන්ම ස්තූති වන්ත වෙනවා අද සභා අයවැය වාර්තාව සභා සම්මත කිරීම පිළිබඳව. දෙපැත්තක් ඇතිව අයවැයට ඡන්දය ප්‍රකාශ කරලා, සභා සම්මත කිරීම පිළිබඳව. මම 2018 පත්වුණු දවසේ ඉඳලා මගේ අයවැයට පක්ෂව ඡන්දය දෙන්න කියලා,මෙතෙක් කිසිම මන්ත්‍රීවරයකුට බලපෑමක් කරල නැහැ. මට ජයග්‍රහණය කළත්, පැරදුනත් කමක් නැහැ. නමුත් මම දන්නවා මම ජයග්‍රහණය කරනවා කියලා. ඒක මගේ හදවතේ තිබුන දෙයක්. මම නැවත වරක් අයවැය ජයග්‍රහණය කරවීම පිළිබඳව ස්තුතිය පුද කරන්න කැමතියි. ඒ වගේම ලේකම්තුමිය ඇතුළු අයවැය වාර්තාව හදන්න යම් වෙහෙසක් දැරූ මාගේ නිලධාරි මඩුල්ලට බෙහෙවින් ස්තූතිය පුද කර සිටිනවා. කතාවක් තියෙනවා, සියලු කුණු යන්නේ බේරුවල් බොක්කට කියලා. ගෝඨාභය මහත්තයට යන්න වුණේ එතුමා කරපු වැරදි නිසා නොවේ. සියලු දෙනා කරපු වැරදි නිසා. ඒ වගේම තමයි මටත් වෙලා තියෙන්නේ. මම කරපු වැරදි නිසා නෙමෙයි නිලධාරීන්ගෙ මන්ත්‍රීවරුන්ගේ අඩුපාඩු මගේ පිටින් තමයි යන්නේ. ඒක මම ඒතරම් ගණන් ගත යුතු නැත. මම 2018 වර්ෂයේ මෙම සභාවේ සභාපති ධූරයට පත් වුණා. එදා සිට මෙම අවුරුදු පහ තුළ අජිත් මහත්මා වගේ, 2002 මම මුලින්ම මේ සභාවට එන විට මොනවත් මේ දේවල් සම්බන්ධව දැනගෙන හිටියේ නැහැ. 1991 මම ඡන්දය ඉල්ලුවනම්, මගේ ජයග්‍රහණය මම දන්නවා. මම

අහම්බෙන් දේශපාලනයට ඇදල දැම්මෙ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා වන නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා. මම දේශපාලනයට එන්න හිටපු කෙනෙක් නෙවෙයි. මම දේශපාලනය දන්නේ නැහැ. මොකද සමාජ සේවාවක් විතරයි දන්නේ. දේශපාලනය කියන චරිත පිළිබඳ දන්නෙ නැහැ. 2002 සිට සභාපතිවරු කිහිප දෙනෙක් යටතේ මම ඉඳලා තියෙනවා. මමත් ඔය සියලු දෙනාගේම කරපු කියපු දේවල් සේරම දන්නවා. නමුත් මම කැමති නැහැ, අතීතය හාරා අවුස්සන්න. කාගෙවත් වැරදි පවසන්න හා කාටවත් වැරදි කියන්න මම කැමති නැහැ. මම කාවවත් පාවා දෙන්න යන්නෙත් නැහැ. කේලම් කියන්න යන්නෙත් නැහැ. ඕපදූප අහන්න යන්නෙත් නැහැ. මේ සභාවේ නිලධාරියෙක්ගෙන්වත් කේලම් අහන්න,ඕපදූප අහන්න මම ගිහිල්ලා නැහැ . මම බලාපොරොත්තු වුණේ සියලු දෙනාම මා සමග විශ්වාසයෙන් කටයුතු කරයි කියලා. නමුත් මෙතන යම් යම් වැරදි හෝ ඇති. කොහේවත් අය ඇවිල්ල මෙතන කෑගහනවා. මෙන්න මෙහෙම වුණා කියලා. නමුත් ඔප්පු කිරීමක් නැත. අද සමහර මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශිත කරුණුවලට මීට ප්‍රථම කිහිප අවස්ථාවකම මම පිළිතුරු දී ඇති බව පසුගිය වාර්තා නැවත පරිශීලනය කළොත් බලාගත හැකි බවත්, ප්‍රකාශ කරන්න කැමතියි. මම නිලධාරීන් ආරක්ෂා කරන්න යන්නේ නැහැ. මම 2018 ඉඳලා ඇවිල්ලා ලේකම්ලා පස් දෙනෙක් එක්ක හිටියේ. වැඩබලන ලේකම්ලා තමයි සියල්ලෝම. මම දන්න විදියට ෆර්සියා ලේකම්තුමිය තමයි ලේකම්වරියක් ලෙස හරියට වැඩ කරගෙන ගියේ. එතුමියගේ වැඩපිළිවෙළ තමයි මම දිගට කරගෙන ගියේ. ඊට පසුව ආවා ලේකම්වරියක්. ඇය අවුරුද්දකින් විශ්‍රාම ගියා. අපේ වැඩ බලන ලේකම්වරියක් හිටියා, එතුමියත් ස්ථාන මාරු වී ගියාට පසුව අද සිටින ලේකම්වරිය පත්කරගත්තා. අපේ සභාවෙන් විය යුතු දේවල් කරන්න කම්කරුවො අඩු වුණා. මීට පෙර සභාවේ කම්කරු සේවකයන්ට අඩුවෙන් තමයි නිලධාරීන් හිටියේ. එදා සභාවෙ වැඩ කෙරුණා. ඉස්සර මන්ත්‍රීවරු දහතුන් දෙනයි හිටියේ. නමුත් වැඩ කෙරුණා. අපි සාධාරණීකරණය කරන්න යන්නේ නැහැ. ඉස්සර එහෙම සිදු වුනා. අපි ආදායම අනුව තමයි වියදම් කරන්නේ. නමුත් මම මගේ දේවල් කියලා, වෙනමම මට, ගමට, කළේ නැහැ. මගේ හදවත ඒක දන්නවා. මොකද මම කාටත් එකයි. මෙතුමා කිව්ව වගේ කොට්ඨාස ක්‍රමය මහා ජරාජීර්ණ දේශපාලන ක්‍රමයක්. ඉස්සර මට බල ප්‍රදේශයේ කොහේ ගියත් ඕනම දෙයක් කරන්න පුළුවන්. නමුත් දැන් බල ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගෙන් අහල කරන්න ඕන. එහෙම නොවුණොත් බැන බැන යනවා. මම කියන්නේ ඒ කොට්ඨාසයේ මන්ත්‍රීතුමාත්, මන්ත්‍රීතුමියත් එක්ක එකතු වෙලා කරන්න පොදු දේවල් කියලා. නමුත් අපිට කියනවා සත්භාවයෙන් සාධාරණ වෙන්න කියලා කියනවා. නමුත් කියනවා වගේ නෙමෙයි වැඩ. මම මේ අසරණ වෙන්නේ මම නිසා නෙමෙයි, යම් යම් කොට්ඨාස නිසා, මම නිතරම බැනුම් අහන්නේ ඔය කාරණා නිසා. අර මහින්ද මහත්තයා කිව්ව වගේ සියඹලා මල්ලෙ සියඹලා ඇත්තේම නැද්ද? ඕක තමයි අපටත් අහන්න වෙන්නේ. අපි කලේම නැද්දෙ කියලා.

ගරු මන්ත්‍රීවරුනි 2018 ඉඳලා කොතරම් ව්‍යසන ලංකාවේ ඇති වුණත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරු යම් වැඩක් කළා. පාරවල් හැදුවා. ගෙවල් හැදුවා. බඩුමුට්ටු බෙදුවා. යම් දෙයක් කලා. භීෂණ කාලේ තියෙද්දි පාරවල් කාපට් කළා. නමුත් මේ අරගලය මැද්දේ සියලු දේවල් අවුල් වුණා. වසන්ත මන්ත්‍රීතුමා කියපු පාරත් කාපට් කරන්න තිබුණේ. ඒ හැමදේම කරලා තිබුණා නම්, ඒ සල්ලි ගෙවලා. නමුත් මේ අරගලය මැද්දේ ඒ සේරම දේවල් කොන්ත්‍රාත්කරුවන් විසින් නතර කළා. ඔබතුමාලට මතක ඇති මුල් කාලේ මේ සභාව තියෙන දවසකත් සභාව ඉදිරිපිටට ඇවිල්ලා අරගලකරුවන් අරගල කළා. ඒක ඒ කාල වකවානුව අනුව මිනිසුන්ට දරාගන්න බැරි පීඩනයක් තිබුණු නිසා. ඒක අපි පිළිගන්න ඕන, ඒක අපට විතරක් නෙවෙයි, මුලු ලංකාවටම වුණු දෙයක්. මේ දේශපාලන ක්‍රමය වෙනස් කරන්න කියන්නේ ඇයි? මේ දේශපාලනමය කොට්ඨාස ක්‍රමය හොඳ නැති නිසා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි, දකින්න සාධාරණව, සාධාරණව පිළිගන්න ඕන. නිතරම මන්ත්‍රීවරු අපහසුතාවයට පත්වෙනවා. සත්‍ය ඕක. මගෙත් සිහිනයක් තිබුණා, මොනයම් දෙයක් හෝ අපිත් කළ යුතුයි කියලා. මේ කලබල අස්සේ ඒ දේ අපට කරගන්න බැරි වුණා. ඒ හැර වෙන

කිසිම දෙයක් මෙතැන සිද්ධ වෙලා නැහැ. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමාලා වගේම අපි බලාපොරොත්තු වෙනවා, ගමට වැඩ කරන්න. නමුත් අපි කරගන්න බැරි නම් අපි මොනවද කරන්නේ, පුළුවන් දේවල් කළා. නමුත් විසිහත් දෙනාටම සාධාරණයක් කරන්න බැරි වෙන්න ඇති. ඒ කරන්න බැරිවුනේ මටත් වෙන බලපෑම් තිබෙන නිසා. මගේ හෘද සාක්ෂියට අවංකව කරන්න තිබුණ නම්, මේ කිසිම දෙයක් මට අහන්න වෙන්නේ නැහැ. වනමල් මන්ත්‍රීතුමා කිව්වා  නිලධාරියෙක් මාරු කරා කියලා. එතුමා උඩුගම රෝහලේ ඉඳලා මෙතනට එන විට අතිරික්ත වුණත්, මම කිව්වා එන්න කියලා. මම හිතුවා පිරිමි නිලධාරී නැති නිසා, ඒක අපට ශක්තියක් වෙයි කියලා. නමුත් අපට වැඩක් කරද්දි තමයි,  ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුකාර කාර්යාලයට එම නිලධාරියා බඳවා ගත්තේ. මම සමග වාද වුණා. මම අත්සන් කරන්නේ නැහැ කියලා. පසුව මම ඉල්ලා සිටියා. මේ නිලධාරියා නැත්තම් වෙන නිලධාරියෙක් හරි දෙන්න කියලා. නමුත් එම නිලධාරියා කරගෙන ගිය දේවල්වල ප්‍රතිඵල අපට ලබන්න වුණේ නැහැ. එම නිලධාරියාගේ ඉල්ලීම පිට තමයි එම නිලධාරියා ස්ථාන මාරුව හදාගෙන ගියේ. මම මීට වඩා යමක් කියන්න යන්නේ නැහැ. මම සභාවට සම්පත් එකතු කරල දීලා තියෙනවා. මම සභාවේ සම්පත් අනිසි ආකාරයෙන් භාවිතා කරල නැහැ. ඒවා ගැන වැඩියමක් කියන්නෙත් නැහැ. කම්පා වෙන්නෙත් නැහැ. මාපලගම ක්‍රීඩාපිටිය ලක්ෂ 60ක වියදමින් සංවර්ධනය කර, ලක්ෂ 10ක වියදමින් කල ළමා ක්‍රීඩාපිටියත් විවෘත කිරීමට හැකියාව ලැබුණේ නැහැ. ඒකත් එක්ක පෙර පාසල්වල ගුරුවරුන් අපෙන් ඉල්ලුවා අපට තනියම පෙර පාසල් උත්සව කරගන්න විදියක් නැහැ. වෙන වෙනම උත්සවය කළොත් විශාල වියදමක් යන නිසා, එක උත්සවයක් කරන්න කියලා. ඒකයි, ළමා උද්‍යානය විවෘත කිරීම ඒ එක්කම ක්‍රීඩා පිටිය විවෘත කිරීමත් මුල් කොට ගෙන, උත්සවයක් සංවිධානය කරලා, වියදම් නොකර අප බල ප්‍රදේශයේ ඇති වතු සමාගමක් සමග සාකච්ඡා කොට, සභාවෙන් මුදල් අය නොකර මෙම උත්සවය සිදු කරන්න. ඒ අනුව අපට වටවල වැවිලි සමාගම හා දෙරණ ආයතනය පොරොන්දු වුණා. අවශ්‍ය සහාය ලබාදෙන්න, ඒ අනුව එළඹෙන 22 වන දින මාපලගම ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේදී එම උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු කිරීමට අප බලාපොරොත්තු වුණේ. මේ වන විට ඔබතුමාලට ආරාධනාව ලැබිලා ඇති. මේ සඳහා සියළුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් සභාවේ දරුවන්ට ශක්තියක් වන්න කියා ඉල්ලමින්, කොහොම නමුත්, ගරු මන්ත්‍රීවරුනි, මේ අවුරුදු හතර පහ තුළ මොන ගැටලු ඇති වුනත්, අපි අතර එකාමෙන් හදවතින් අපි වෙනස් වෙලා නැහැ. කවුරුත් මෙතන කිව්ව වගේ, මළ ගෙවල් වල යන්න බැරි කමක් මට නැහැ. දැන් මම මළ ගෙවල් වල තනියම ගිහිල්ලා ඇවිල්ල තියෙනව කිසිදු කරදරයක් නැතිව නිරුපද්‍රිතව. අද දින ඉදිරිපත් කල 2023 වර්ෂය සඳහා අයවැය වාර්තාව සම්මත කිරීම පිළිබඳව, එයට සහය දැක්වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, මෙයට සාම්ප්‍රදායිකව විරුද්ධව අදහස් දැක්වූ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනාට සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ලබන්නා වූ 2023 වර්ෂය අරගලවලින් තොර සෞභාග්‍යමත් නිදුක් නිරෝගී, වාසනාවන්ත ජන ජීවිතයක් ගත කිරීමට වාසනාව, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන ගමන්, අයවැය වාර්තාව සැකසීමට සහය දැක්වූ සියළුම නිලධාරීන්ට මෙන්ම මෙය සභා සම්මත කිරීමට සහය දැක්වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිය පුද කරමින්, මම නිහඬ වෙමි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                                  දිනය:-